Annexure to the Invitation

**<u>සංවාදයක් තුලින් තීන්දු වලට එළඹීමට සැමට ඇරයුමක්!</u>**

**<u>උනේ කුමක්ද? වෙමින් තියෙන්නෙ කුමක්ද? වෙන්න යන්නේ කුමක්ද?</u>**

උක්ත තේමාව යටතේ දින කිහිපයකට පෙර ඔබ වෙත ලැබුණු ඇරයුමේ අවසානයට සඳහන් කර තිබූ ‘සංවාද සටහන මෙතැන් සිට ඔබට කියවීමට හැකිය. ඒ මගින් කිසිවකුව බැඳ තැබෙන්නේ නැත. නමුත් වර්ෂ බාගයක පමණ කාලයක් තිස්සේ එකම දෘෂ්ඨී පථයක් තුලින් ප්‍රචලිත කෙරන සටන් පාඨ, විවේචන, විමර්ශන වලින් පිරී ඇති සිතිවිලි පරම්පරාවන් වෙත, මේ සටහන වෙනත් සිතිවිල පරම්පරාවක් ගෙන එනු ඇතැයි සිතමු. ප්‍රථමයෙන්ම කෝප වන්නා ජයග්‍රාහී වන්නේ යයි හොර මැර කණ්ඩායම් අතර පවතින අදහසකි.

නමුත් කෝපය පමණක් මදිය. කාලය-දේශය හා ලෝකයේ තත්කාලීන අවදිය ගැන නිවැරදි හා පැහැදිලි තේරුම් ගැනීමක් අත්‍යාවශ්‍ය වේ. ක්‍රියා කළ යුත්තේ ඒ සමඟිණි. මේ සාකච්ඡාව ඒ වෙනුවෙනි.

**<u>පිවිසුම</u>**

ලංකාව මේ වන විට බොහෝ රිදුම්දෙන ආර්ථික ප්‍රතිසංස්කරණයන්ට මුහුණ දීමට නියමිතව සිටී. වසර 75 ක සමාජ ආර්ථික ප්‍රතිපත්ති වල කෙලවර ලද එල දීම එවැනිය. මේ ගතවූ වසර හැත්තෑ පහ දෙස එළඹි සිහියෙන් යුතුව ආපසු හැරී බලන්නෙකුට, මේ එලදී ඇත්තේ කාගේ, කුමන ආර්ථික ප් රතිපත්තිය දෝයි උභතෝකෝටිකයකට මුහුණ දීමට සිදු වෙයි.

මන්දයත් ලංකාවේ සමාජ/ආර්ථික ප්‍රතිපත්ති හෝ ඒවා මත පදනම්වූ ‘සැලසුම්’ කිසිවක් විස්තීර්ණ (Comprehensive) ඒවා නොවූ නිසාය. එහි අරුත; රටේ පාලනය බාරගත්තෝ මෙහි පවතින විශේෂිත සමාජ ආර්ථික සබඳතාවයන් හා ඒවායේ මූලාශ්‍රයන් හා මූලිකාංග පිලිබඳ පෘතුල සාකච්ඡාවක් මගින් ඇතිකරගන්නා තේරුම් ගැනීමකින් යුතුව ඉදිරි ප්‍රතිපත්ති සකසා, ඒ මත ධරණීය දේශපාලන හා සමාජ/ආර්ථික සැලැස්මක් සැකසීමට වෑයම් නොකළ බවයි.

ඒ වෙනුවට කලින් කල මතුපිටට එන අවශ්‍යතා හා ප්‍රශ්න අනුව එන එන හැටියට මුහුණ දීම, පාලනයට සම්බන්ධ සියළුම දේශපාලන පක්ෂ හා දේශපාලනඥයන්ගේ පිලිවෙත විය. ඒ අනුව වසරෙන් දෙකෙන් නැත්නම් පහකින් උඩයට මාරුවන ආර්ථික පිලිවෙත් අපට දක්නට ලැබේ. මේ ප් රතිපත්ති විරහිත චපල පාලකයන් ලෝක ධනවාදය ඉදිරියේ අවිස්වාස කටයුතු ලෙසින් පෙනී ගියා නිසැකය. කඨෝර උපයෝගීතාවාදී හා අනුභූතිවාදයේ හරයෙන් උපත ලද “ප්‍රශ්නය ඔබට කරදර කරන තුරු ප්‍රශ්නයට කරදර නොකරන්න!” යන මධ්‍යම පංතික ප්‍රවාදය මේ උදවියගේ ආදර්ශ පාඨය වූවා සේ ය.

සැබැවින්ම මේ උපයෝගිතාවාදී (ප්‍රායෝගික ප්‍රතිඵලවාදය) හා අනුභූතිවාදී පිළිවෙත මොවුන් අපරයුධ ජාත්‍යන්තර ධනවාදයේ අධිපතීත්වයට පත් දාර්ශනික චින්තනය කෙරෙන් ලත් දායාදයකි. අපර යුධ උත්පාතයට අවශ්‍ය ආර්ථික න්‍යායික අවි සපයා ගැනීමේ දී මධ්‍යගත අධිරාජ්‍යවාදයට මේ දාර්ශනික පදනම් ඉතා ප්‍රයෝජනවත් වූ බව සැබෑය. නමුත් මෙය කිසිසේත්ම අපගේ වැනි යටත් විජිතවාදී අච්චාරුගත සමාජ/ආර්ථික යථාර්ථයට පිළිතුරු සොයාගත හැකි ලෝක දෘෂ්ඨියක් නොවී ය. මේ දෘෂ්ඨියට ලංකාවේ සමාජ ආර්ථික වෘධියට අත්‍යාවශ්‍ය වූ ව්‍යුහාත්මක පරිවර්තනයන්, නැතිනම් විප්ලවකාරී කර්තව්‍යයන් දර්ශනය නොවූ අතර එසේ වන්නේ ද නැත.

සමාජ පරිවර්තනයේ නිවැරදි කර්තව්‍යයන් හඳුනා ගැන්මට හා නම්කර ගැන්මට හැකිවන්නේ, සමාජ පරිවර්තනයේ තත්කාලීන අවදිය ගැන නිවැරදි හා පැහැදිලි තේරුම් ගැනීමක් ඇතුලත පමණය.

**ලංකාවේ අධිපති දේශපාලන චින්තනයේ පදනම**

ලංකාව දේශපාලන නිදහස ලද ද; පැවැති බ්‍රිතාන්‍ය යටත් විජිත සමාජ-ආර්ථික රටාව හා ඒ ආශ්‍රිත සමාජ සංකල්පයෙන්ගේ පර්වර්තනයක් වූයේ නැත.

බ්‍රිතාන්‍යයෝ ලංකාව ධනේශ්වර නිෂ්පාදන සබඳතා වලට ඇතුල් කර ගත්තද, ධනපති නිෂ්පාදන සබඳතා සම්පූර්ණ කළේ නැත. ඔවුන් ගෙන ගිය යටත් විජිත ආර්ථික ක්‍රමය පූර්ව ධනවාදී සහ අර්ධ ධනවාදී ලක්ෂණයන්ගේ මිශ්‍රණයක් ලෙස නිමවා තිබුණි. විවිධ නිශ්පාදන ක්‍රමයන්ගේ මෙම සහ-පැවැත්ම පූර්ණ ධනේශ්වර වර්ධනයක් ඇති වීමට ඉඩක් තැබුවේ නැත. අඩු දියුණු රටවල් ලෙසත්, පසුව ගෞරවණීය අරුතකින් දියුණු වන රටවල් ලෙසත්, ලංකාව හා සමාන රටවල් හඳුන්වනු ලැබීමේ විෂයබද්ධ හේතු එසේ ය. මෙහි දී දියුණුව යනු 'සංවර්ධිත' රටක ආදර්ශයකට ගැලපෙන තත්ත්වයක් ලැබීම ය.

බ්‍රිතාන්‍ය පාලකයන්ට තම තන්ත්‍රය පවත්වා ගැන්මට හා රැක ගැන්මට හැකි වූයේ ඒ ආකාරයෙනි. එනම් ධනේශ්වර නිෂ්පාදන සබඳතා සමඟ එකටම තිබෙන අනෙක් අර්ධ හා පූර්ව ධනවාදී ක්‍රමයන් රැකෙන්නට හැරීමෙනි.

ඒ මගින් බ්‍රිතාන්‍ය රැජින තමන්ගේ ද රැජින ලෙස පිළිගන්නා වූ උඩරට සම්ප්‍රදායික ප්‍රභූ පැලැන්තිය හා ඒ අකාරයට පහත රට වාණිජ ප්‍රාග්ධනයට ඇතුල්ව සිටි පිරිස් ද ප්‍රභූ පැලැන්තියකට ඇතුළු කිරීමෙනි. වැවිලිකරය හා නාගරික ප්‍රදේශ පාලනය තමන් අත තබා ගත් සුදු ජාතිකයන්, දිසා භාරව සුදු දිසාපතිවරුන් පත් කරන ලදී. මේ දිසාපතිවරු සතු කොපමණ බලතල තිබුණත්, සම්ප්‍රදායික ගම් පාලනය කිරීමේ සියළු කටයුතු රජය විසින් මේ 'ප්‍රභූන්' හා ප්‍රභූන්ගේ අනුමැතියෙන් පත්කරන (ඔවුන්ගේ හිතෛශී අන්තේවාසිකයන් වන) ගම් මට්ටමේ විවිධ මුලාදෑනියන් මගින් කර ගන්නා ලදී. එබැවින් මේ පුද්ගලයන් නිංදගම් ලෙසින් හෝ වෙනත් සේවාවන් සඳහා රජුන් වෙතින් ලැබ තිබූ කිසිදු ප්‍රදානයකට (ගැමි කෘෂිකර්මයේ ප්‍රධාන කොටසක් වන ඉඩ කඩම් හා ජල සැපයිම් මාර්ග මෙන්ම වැසියන්ගෙන් සේවා ලැබීමේ අයිතියට) සුදු පාලකයන් අත තැබුවේ නැත. 11-12 ශතවර්ෂ වල දී එංගලන්තයේ බැරන්වරු සතු කොපමණ බලතල තිබුණද, ජනතාව හා රජු අතර සියළු කටයුතු ඉටු කළ ෂෙරීෆ්ලා (කෝරාළලා) මෙනි. මේ ලාංකීය 'ෂෙරීෆ්ලා' ඉංග්‍රිසි පාලකයන්ටත් ඉහලින් ගැමි ජනයා පෙළමින් ඉංග්‍රීසි පාලනය හා එහි ආදායම් රැක දුන්නෝ ය.

එසේ හෙයින් ධනේශ්වර සබඳතා සමග අර්ධ හා පූර්ව ධනවාදී ග්‍රාමීය සමාජ/ආර්ථික සබඳතා එසේ තිබෙන්නට හැරීම අතපසු කිරීමක් නොව; බහුතර ජනතාවක් ස්වකීය වූවන් ලෙසින් දර්ශනය වන නායකයන් මගින් පාලනය කිරීමේ දැනුවත් දේශපාලන පිළිවෙතක් විය.

අනෙක් අතට ජාතික ධනේශ්වරයත් මෙයාකාර වූ ගන්දබ්බ ධනේශ්වර නිෂ්පාදන සබඳතා වර්ධනය තුලින් නැගී ආවක් නිසාම, කම්කරු පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාවගේ තර්ජනයට මුහුණ දීමට ඔවුන් අනුගමනය කළේ ද බ්‍රිතාන්‍ය පාලකයන් සේ ම පූර්ව ධනවාදී සමාජ මූලයන් සමඟ අත්වැල් බැඳ ගැනීමේ උපායික පිළිවෙත තුලිනි.

ඒ අතර ප්‍රභූන්ගේ බලය හා අන්යෝන්‍ය පැවැත්ම සමඟ සහබන්ධනයෙන් (Correlation) බැඳුණු විහාර හා ඒ ආශ්‍රිත දේවාල ද (ඒවායේ දේපල හෙවත් 'විහාර දේවාල' ගම් ද) මේ පූර්ව ධනවාදී සමාජ මූලයන් අතර වූයේ ය.

මේ සහබන්ධනයෙන් ලංකාවේ දේශපාලන ඉතිහාසය පිලිබඳවත්, එහි ඇති සිංහල බෞද්ධ උරුමය පිළිබඳවත් මතවාදයන් ගොඩ නගනු ලැබිනි. ඒ මගින් ඉංග්‍රීසීන් ගේ 'බෙදා පාලනය කිරීමේ' ප්‍රතිපත්තිය වඩාත් ශක්තිමත් තැනකට සිංහල බෞද්ධ ආධිපත්‍ය මතවාදය යටතේ ගෙන එනු ලැබිණි.

මේ අධිපති මතවාදය සැබෑ ධනේශ්වර සංවර්ධනයකට අත්‍යාවශ්‍ය යථාවාදය, සමාජ බලයක් වීමට මුළුමනින්ම හරස්ව පිහිටියේ ය.

ඒ නිසාම බටහිර යුරෝපා රටවල වූ ආකාරයේ වර්ධනයක් කරා ලංකාව වැනි අර්ධ සංවර්ධිත රටවල් වලට ගමන් ගැනීමට හැකි වූයේ නැත. මන්ද යත් යටත් විජිත ආර්ථික ක්‍රමය සංක්‍රමණීය එකක් නොව, නිෂ්පාදන බලවේග වල වැඩිදුර වර්ධනයට බාධාකාරී වූ යල් පැන ගිය ක්‍රමයක් වීම නිසා ය. එදා මෙදා තුර ආර්ථික, සමාජ, දේශපාලන තලයන්හි මතුවූ ප්‍රශ්න වලට කිසිඳු නිෂ්චිත උත්තරයක් දීමට මෙම ක්‍රමයට හැකියාවක් නොවී ය.

**"ලාංකීය සමාජවාදය" සිහිනය හා යථාර්ථ ය**

'ලාංකීය ගන්ධබ්බ ධනවාදයෙන්' සේම 'ලාංකීය සමාජවාදයෙන්' ද ප්‍රකාශිත වූයේ ගන්ධබ්බ අපදානයක්; වෙනත් වචන වලින් කියන්නේ නම් එලොවටත් මෙලොවටත් නැති චරිතාපදානයක් ය.

'ලාංකීය සමාජවාදයේ' ස්වෝත්සාහවාදය මුල් කොටගත් ස්වාධීන සමූහ හා සමූපාකාර ගොවිපලවල් රැවටිල්ලක් පමණක් බව එළිදරව් වී සෑහෙන කලකි. අසංවර්ධිත රට වල අනාගතය කුඩා පරිමාණ නිෂ්පාදන හා සමූහ ගොවිපලවල් මගින් ඇතිවන ගැමි සමාජවාදයක් හැටියට පෙන්වීමට සමහර 'සමාජවාදියෝ' තැත් කළහ. එසේම; සමාජවාදය කරා මාවත ලෙස උත්කර්ෂයට නැංවූ ඊනියා 'ජනසතු ක්‍රමය'; ඇත්ත වචන වලින් කියන්නේ නම් 'රාජ්‍ය ධනවාදී පිලිවෙත්', යම් කාලපරිච්ඡේදයක් සඳහා පුද්ගලික අංශයේ ප්‍රාග්ධන අභේනියට කර දීමක් ලෙස වැදගත් වැඩ කොටසකට උරදිය හැකිව තිබුණි. නමුත් මේ යථාර්තය උඩු යටිකුරු කර, එය 'සමාජවාදය ගොඩනැගීමේ මූලාරම්භයක්'ලෙස ඉදිරිපත් කිරීම, ජනතාව මත බරවා කකුලක් කරගැස්වීමක් බවට පත්ව බොහෝ කලකි. මේ 'පූර්ව සමාජවාදී අංගෝපාංගයන්' යන න්‍යාය මගින් ඒවා රජයේ වෙළඳ ව්‍යාපාරයන්ය යන සත්‍ය ආවරණය කර, 'ජාතික සම්පත්' බවට ඔසවා තැබිණි. ඒ අනුව රජයන්නේ, මේවා 'ජාතික සම්පත්' බැවින් භාණ්ඩාගාරයේ මුදලින් (බදු මුදලින්) හෝ රැක ගත යුතුය යන මතයයි. දියට දැමීමේ දී ඇන්නැවේ කී ඉබ්බා අනුව යමින් පාලකයන් එම මිත්‍යාවට ඉඩ දී කරබා සිටින්නේ, මේ ඊනියා ජාතික සම්පත් තම දේශපාලන ආධාරකරුවන්, ඥාති හිතමිත්‍රාදීන් විසින් තම තමන්ගේ දඩබිම් බවට පෙරලාගෙන සිටින නිසාය.

තවත් සමාජවාදී කුළකයක් ඉදිරිපත් කළ "ධනේශ්වර නොවන සංවර්ධනය" පිළිබඳ අදහස් ද එවැනිය. ඔවුන්ට අනුව සුළු ධනේශ්වරයත්, එපමණක් නොව සමහර ධනපති කොටස් පවා 'ප් රගතිශීලී' වන බැවින් ඔවුන් ද ධනපති නොවන සංවර්ධන මාවතේ ගමන් කරන්නේ ය. මෙම පිරිස් වඩාත්ම අවධාරණය කරන්නේ සුළු ධනේශ්වරයට ස්වාධීන බලයක් ලෙසින් ධනේශ්වර වර්ධන මාවතෙන් කැඩී සමාජවාදී මාවගේ ගමන් ගැනීමට ඇති හැකියාව ගැනය. එසේ ස්ථාපිතව පවතින ධනේශ්වර රාජ්‍ය යන්ත්‍රය විනාශ නොකර, ('ප්‍රගතිශීලී' ධනේශ්වර හා සුළු ධනේශ්වර කොටසක් සමඟ එක්ව සාදන සභාග ආණ්ඩුවක් යොදාගෙන කරන) ආර්ථික ප්‍රතිසංස්කරණ තුලින් සමාජවාදය කරා "සාමකාමී මාවතක්" ඇත යන මතය ස්ථාපිත කෙරිණි. ඒ මගින් සමාජවාදී පර්වර්තනය ඇරඹීමේ දී ප්‍රාථමික වන නිර්ධන පංතියේ රාජ්‍ය බලය පිළිබඳ ඓතිහාසික අවශ්‍යතාවය අදාල නොවන්නක් බවට පත් කෙරිණි.

මේ අමන න්‍යායික අපරාධ "සමාජවාදී" ගමනකට මග නොපෙන්නුවා පමණක් නොවේ. සමාජ පරිවර්තනයේ ප්‍රජාතන්ත්‍රීය විප්ලවයේ කර්තව්‍යයන් නිවැරදිව හඳුනා ගැන්මට හා නම්කර ගැන්මට අවශ්‍ය සාකච්ඡාවන් අහුරා දැම්මේය. පූර්ව ධනේශ්වර සබඳතා බිඳ, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රීය විප්ලවය ඉදිරියට ගෙනයෑම සඳහා නායක්වයක් ලෙස ඉදිරිපත්වීමට නිර්ධන පංතියට තිබූ ශක්තිය දියකර හැරියේ ය. ග්‍රාමීය ප්‍රභූ බලයට අභියෝග කරමින් යුක්තිය හා සාධාරණය වෙනුවෙන් සටන් කළ ග්

රාමීය සංවිධාන රටාවන් ද ක්‍රමයෙන් නිවා දමමින්, නව කොල්ලකාරී ධන බලයකට ගම්මාන යටත් කර ගැනීමට අවකාශය සැලසීය. ඒ අනුව ලෝකයේ ආර්ථික උත්පාතය හා ඒ ආශ්‍රිතව වර්ධනය වන ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන් සමඟ සබඳතා වර්ධනය කරගනිමින් අත්පත් කරගත හැකිව තිබූ සමාජ ආර්ථික වෘධියටද මඟ අහුරාලන ලද්දේ ය.

මේ ගතික බලයෙන් තොර නිශ්චල ආර්ථික ක්‍රියාකාරීත්වය ජනිත කළේ ජව සම්පන්න සමාජයක් නොවේ. උදාසීනත්වයයි, ක්‍රියා කිරීමට සහ/හෝ වෙනස් වීමට හැකියාව නැති, හෝ අවශ්‍ය මොහොතේ යලි හැඩ ගැසීමට නොහැකි, ප්‍රතිවිරෝධය නොපන්නා වූත් සනීභූත සමාජයකි.

විප්ලවකාරී මතවාදයන් වෙනුවට රට වසා පැතිර ගියේ ජාතිවාදයේ සනාංධකාරය යි. ඒ මගින් ඓතිහාසික මිත්‍යාවන් හා ගුඨවාදයන් සමාජය වසා ගත්තේ ය. ගුඨවාදයන්ගේ පැතිරීම හරහා ගමේ ජනයා පුඹුදුවා ගැනීමේ අවස්ථාව අභිමිවී ගියේය. සමාජයෙන් නොලැබෙන සමාජ ආර්ථික ආරක්ෂාව පතා දේව රූප වලට, මැටියෙන්, ගඩොලින් ඉදිකළ ප්‍රතිමා දාගැබ්, සොබාදහම හා ගහ කොළ ඉදිරියේ දණ ගැසීමේ කරුණ තුළින් තමා අවමානයට පත් වීම ප්‍රදර්ශනය කරමින් සිටින ජනතාව, පහසුවෙන්ම ඒ සුපුරුදු වන්දනා සමඟින් අසහාය බලයට වන්දනා කිරීම යලි ඉස්මත්තට ගත්තෝ ය. ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් රාජයයක් වෙනුවෙන් වූ අරගලයන් වැසී ගියේ මහ රජාණන් වරුන් හා සේනාපතියන් සමාජයේ බලකණු කිරීමෙනි. ප්‍රජාතන්ත්‍රවාදය අපරාධයක් බවට පෙරළිනි. ෆැසිස්ට්වාදී මතයන්, බලාපොරොත්තු කඩ වූ ගම් බිම් සිසාරා පැතිර ගියේ ය. දූෂණ වංචා වැසීගියේ ඒ ධන බලයෙන් ලත් 'ප්‍රභූ' තනතුරු වලිනි. ඔවුන් සමාජයේ විරුවන් බවට පත් විය. ජන ඝාතනය හා '(සිංහල බෞද්ධ) දේශ ප්‍රේමය' විමුක්ති මාර්ගය බවට පත් විය.

එකතැන පල්වෙන මේ කුසීත දිවි පෙවෙත, ප්‍රතිවිරෝධය නො පාන්නා වූ මේ පැවැත්ම, අනෙක් පසින් වනචාරී වූ ද, අරමුණු රහිත වූ ද, අසීමිත වූ ද විනාශකාරී බලවේගයන් උත්පාදනය කොට ඇති බව අත්දැකීමට ලැබුනේ වරක් දෙවරක් නොවේ.

**ගන්ධබ්බ භාවයෙන් මිදී ප්‍රතිසංධියක් ලැබීම**

මෙතෙක් කතා කළේ සංක්‍රමණීය ආර්ථික වෘධියේ මාවතට එළැඹීමට තිබූ ප්‍රධානම බාධකය වූ යටත් විජිත සමාජ ආර්ථික පදනමින් ලද උරුමය ඉක්මවා යෑමට ලාංකීය ධනපති පංතිය අසමත් විම ගැනයි. වෙනත් වචන වලින් කියනවානම්; මෙවැනි ධනපති ප්‍රජාතන්ත්‍රීය විප්ලවයේ කර්තව්‍යයන් නිම නොවූ රටවල නව පාලකයන් ඉටු කළ යුතු ප්‍රාථමික කටයුත්ත ලෙස ඉතිහාසය විසින් පවරා ඇත්තේ එම කර්තව්‍යයන් ඉටු කිරිම බවයි. නමුත් එසේ තමන් වෙත පැවරී ඇති ප්‍රජාතන්ත්‍රීය විප්ලවයේ කර්තව්‍යයන් තේරුම් ගැනීමට හා ඒවා ඉටු කිරීමට අසමර්ථ වීමෙන් එදා මෙදාතුර ලාංකීය නිදහසේ නායකයන් පවුකාරයන් වී ම ගැනයි.

අඩු දියුණු එනම් දියුණුවේ මාවතට අවතීර්ණ නොවූ රටක පාලකයෝත් අඩු දියුණුවූවන් වේ. එයට සාපේක්ෂව ජනතාවත් ඒ අඩු දියුණු ලක්ෂණ උකහාගත්තෝ ම වෙති.

ලද නිදහස විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රීය පරිවර්තනයන් ඔස්සේ ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය දර්ශනයක් නොතිබීම ඒ අඩු දියුණු බවේ පදනම විය.

ධනේශ්වර ප්‍රජාතන්ත්‍රීය විප්ලවය සම්පූර්ණ කර නොගත් ඕනෑම රටක සංවර්ධන ගමන සඳහා ප් රජාතන්ත්‍රීය විප්ලවයේ ගැටළු හඳුනා ගැනීම ප්‍රාථමික අවශ්‍යතාවයයි. මෙවැනි රටක නිර්ධන පංතියට තම සමාජ බලය තහවුරු කරගනිමින් රාජ්‍ය බලය කරා ගමන් කිරීමට හැකි වන්නේ ද මේ ප්‍රජාතන්ත් රීය ගැටළු වලට විසඳුම් දෙන්නා ලෙසට ය. මේ ගැටළුවක් ගැටළුවක් ගානේ විවිධාකාර අවුල් සහගත තත්ත්වයන් නිර්ධන පංතිය තුළ ඇති වේ. ඒවා පංතියේ සමඟිය බිඳී යෑමට ද තුඩු දේ. එසේ

වන්නේ මුත්, මේ ගැටළු වලට විප්ලවීය විසඳුම් දීමට ඉදිරිපත් වීමෙන්ම සමඟියද ආරක්ෂා වන අතර, ජාතික නායකත්වය කරා යෑමට නිර්ධන පංතියට ඉඩ සැලසෙයි.

ප්‍රජාතන්ත්‍රීය ගැටළු යන්නෙන් අදහස් වන්නේ හුදු තෝරා පත්කරගත් නියෝජිතයන්ගේ ප්‍රශ්න පමණක් නොවේ. එය එක් ප්‍රශ්නයකි.

ආර්ථික වර්ධනය සහ රට සංවර්ධන මාවතකට යොමු කරවීම යන්න හුදු ශිල්පීය දැනුවත්කමේ වර්ධනය පිළිබඳ ප්‍රශ්න කිහිපයක් ද නොවේ. පෙර දැක්වූ සමස්ථ සමාජ ආර්ථික සම්බන්ධතාවයෙන් හි විප්ලවීය පරිවර්තනයක් කිරීමක් වන්නේ ය. අපේ රටේ සමාජ ආර්ථික පෙරලියේ වර්තමාන කර්තව්‍යයන් ඒ අනුව තීරණය වන්නේ ය. රට තුළ කළ යුතුව තිබූ හා කළ යුතු මෙම විප්ලවකාරී වෙනස් කම් නම්;

1. ජාත්‍යාන්තර මූල්‍ය ප්‍රාග්ධනයේ ග්‍රහණයෙන් ගැලවීම සහ යටත් විජිත සමාජ-ආර්ථික රාමුව බිඳ දැමීම.

2. රජය ප්‍රජාතන්ත්‍රීයකරණය කිරීම.

3. ගැමි ගොවි පෙරළියක් කර කෘෂිකාර්මික ක්ෂේත්‍රය නවීකරණය කිරීම.

4. ස්වපාලන පදනම මත සියළු ජාතීන්ගේ සමඟිය ඇති කර රට එක්සත් කිරීම, යනාදිය වේ.

බොහෝ විට උක්ත කර්තව්‍යයන් පරිසමාප්ත ලෙස විසඳීමට ගෝලීය සමාජ යථාර්තය තුළ ඉඩ නැතත්, බොහෝ ප්‍රජාතන්ත්‍රීය ගැටළු වලට දුර දිග යන විසඳුම් ඇති කිරීමට ඉඩකඩ බොහෝ දුරට ඒ තුළින් ම මතුකරගත හැක. එසේම ලංකාව වැනි අඩු දියුණු රටක ප්‍රජාතන්ත්‍රවාදී ගැටළු වලට සැබෑ විප්ලවීය හරයක් ඇත. එනිසා ඒවාට අදාල විවිධ ජන කොටස් දියත් කරන්නේ විප්ලවීය හරයක් ඇති අරගලයන් ය. එහෙත් ඒවාට ස්වාධීනව ගමන් කළ හැකි ජයග්‍රාහී අන්තයක් අද ඉතිරි වී නැත. ප් රජාතන්ත්‍රීය අරගලයන්ට එළඹෙන සුළු ධනේශ්වර හෝ ජාතික ධනේශ්වර නායකත්වයන් අන්තිම වශයෙන් ගත් කල අද ගෝලීය ධනවාදයට ගැට ගැසෙන්නේ ය. එසේ ගැටගැසීමෙන් තොරව සාපේක්ෂ ස්වාධීනත්වයකින් ගනුදෙනු කළ හැක්කේ නිර්ධන පංතියේ බරපතල මැදහත්වීමක් තුළින් පමණි.

මේ ප්‍රජාතන්ත්‍රිය ගැටළු සමහර රටවල ධනපති විප්ලවයෙන්ම මූලික ලෙස සාර්ථකව විසඳී ඇත. මෙය බ්‍රිතාන්‍යයේ ක්‍රොම්වෙල්ගේ සිට වූ විප්ලවීය ක්‍රියාකාරීත්වයෙන්, එනම් 17 වෙනි සියවසේ අගභාගයේ දී සිදු විය. ඇමරිකාවේ නිදහස් සටන තුළ ජෝර්ජ් වොෂින්ටන් කාලයේ දී ද, ඉන් පසුව ඒබ්‍රහම් ලින්කන්ගේ සිවිල් යුද්ධ කාලයේ දී ද මෙම ගැටළු එම රටේ විසඳුනි. 1789 සිට ඇරඹුන ප්‍රංශ විප්ලවයෙන් හා නැපෝලියන්ගේ ප්‍රංශයේ එය සිදු විය. ජර්මනිය, ඉතාලිය, ජපානය යන රටවල් මේ ප්‍රශ්න විසඳුන අනෙක් රටවල් ය. ඒවා 19 වෙනි සිය වසේ සිදු විය. නමුත් ඉන් පසු ඇති වූ අධිරාජ් යවාදී මහා ප්‍රසාරණය තුළ අනෙක් රටවල් වල ධනපති පංතියේ ස්වාධීන ගමනකට ඉඩකඩ විනාශව ගියේ ය.

මදක් සංයුක්තව ගත් කල, මේ ප්‍රජාතන්ත්‍රීය ගැටළු තුලින් පහත සඳහන් දැය ප්‍රධාන වශයෙන් මතු වේ.

**<u>1. රාජාණ්ඩු හා පරම්පරාගත අසහාය බලය :-</u>** පළමුවෙන් ම වටහා ගත යුත්තේ මෙයින් අදහස් කරන්නේ දේශීය හෝ විදේශීය හෝ ඒකාධිපතිවාදයක් ගැන නොවන බවය. ඒකාධිපතිවාදයක් සමහර විට විදේශීය ඒකාධිපතිවාදයක් (එනම් අධිරාජයවාදී) හෝ ධනපති ඒකාධිපතිවාදයක් වන්නට හැකිය. එසේ ම එය සම්ප්‍රදායික අසහාය ක්‍රම විනාශ කරන්නක් ද විය හැකිය. මේ රාජාංඩු වල රාජ්‍ය

බලය ඉහලින් ඇති කරන සම්ප්‍රදායික බලයකි. එය පරම්පරා කීපයක් උඩ පදනම් වේ. ජාතිය හෝ දේශය වෙනුවට ඇත්තේ රාජධානියයි. ඒ තුළ විවිධ භාෂා හා සම්ප්‍රදායයන් ඇති කොටස් සිටිය හැක. ඔවුන් සිටින්නේ රාජ අණසක තුළය. ඒ වෙනුවෙන් රාජ පුරුෂයෝ සිටිති. රාජ පුරුෂයන් රාජ අනුහස ක්‍රියාත්මක කරයි.

සූරා කෑමට ලක්වන කොටස් පාලනය කිරීම එදා මෙදා තුර රජයේ අනිවාර්ය අන්තයයි. එහෙත් අසහාය බලය, මර්ධනයට වඩා දෙයකට ජනයා යට කරයි. එනම් වංශ, පෙළපත් අයිතීන්හි අධිකාර බලයයි. මෙයට ආධාර වන්නේ පන්සල හෝ පල්ලියයි. එමගින් නිශ්චිත සමාජ රාමුවක් වෙනුවෙන් බලවත් ආගමික සම්ප්‍රදායක් ඇති කරයි. එනිසා පල්ලිය පංසල රාජාණ්ඩුවේ අත්‍යාවශ්‍ය කොටසක් වූයේ ය. ධනේශ්වර පන්තිය බොහෝ දුරට මේ ආයතන වලට වඩා තම මතවාදය වෙනුවෙන් කෙලින්ම අධ්‍යාපනික හා සංස්කෘතික ආයතන බිහි කළේ ය.

අප රට වැනි අඩු දියුණු රටක තවමත් ගම් වල අසහාය බලයට හිස නැමීමක් ඉතිරි වී ඇත. ගැමියාට රාජ නීතිය හා පරවේණි බලය ගැන තවමත් හොඳ අවනත භාවක් ඇත. පාලන නිළධාරින් මේ සම්ප් රදායයන් තවමත් භාවිතා කරයි. "හාමුදුරුවනේ, නිලමේ, රාළහාමි" ආදී පැබැඳි නම් පවත්වාගෙන යයි.

මේ අසහාය බලයට විරුද්ධ සටන හුදු ඒකාධිපති පාලනයට විරුද්ධ සටනක්ම හෝ විදේශ පාලනයකට විරුද්ධ සටනක්ම නොවේ. ඒවාත් කෙළවරක තිබිය හැක. එහෙත් හරය එය නොවේ. ඇමරිකානු නිදහස් සටන එනිසා කිරුලට විරුද්ධ සටනක් හා බෙදී සිටි ප්‍රාන්ත එක්වීමේ සටනකි. එය අධිරාජ්‍ය විරෝධී සටනක් නොවේ. 1783 වන විට ඒකාධිකාරී ධනවාදය ක්‍රියාත්මක වූයේ නැත.

**වැවිලිකරය:-** කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයටම අයත් වැවිලිකරය අද පිරිහී යමින් තිබේ. එහි හොඳම මිනුම් දණ්ඩ වන්නේ මෙයට දශකයකට පෙර සිටි වතු කම්කරුවන්ගේ සංඛ්‍යාවෙන් කාලකට පහත බැස තිබීම ය. වැවිලිකරය සේවකයන්ගේ පැත්තෙන් ගත් කල සැම පැත්තකින්ම කඩා වැටී තිබීම මෙසේ සේවක සංඛාව පිරිහී යෑම මගින් පෙන්නුම් කරයි.

මෙහිදී ක්ෂණික කටයුතු ලෙස වැවිලිකරයේ ඉඩම් වල බෝග විවිධාංගීකරණය සහ ඉඩම් වඩාත් තියුණු ලෙස පරිහරණය කිරීම සඳහා කඩිනම් සැලසුමක් දියත් කළ යුතුව තිබේ. අත්හැර දමා ඇති සත්ත්ව පාලනය සඳහා යලිත් යටිතල පහසුකම් සලසා දිය යුතුය. හැම වතු යායාකම වතු සේවක සභා ඇති කළ යුතු අතර, නිෂ්පාදනය ගැන සොයා බැලීම මෙන්ම වතුයාය තුළ සමාජ පාලනයද, වතු බෝග වගා අංශ හා සත්ත්ව පාලනය ද මේ සේවක සභා වල අධීක්ෂණය යටතේ සැලසුම් කළ යුතුය. ඒ ඒ වතුවල සේවක සභාවන්ගේ නියෝජිතයන්ගෙන් සැදුම් ලත් මධ්‍යගත මණ්ඩලයක් මගින් මෙහි ජන ජීවිතය පිළිබඳ ප්‍රශ්න වලට පිලිතුරු සපයා ගත යුතුය.

**<u>2.ඉඩම් විප්ලවය හා ග්‍රාමීය පැරණි බැඳීම්:-</u>** පැරණි රටාව තුළ ගැමියා ඉඩමකට හෝ සමාජ තට්ටුවකට හෝ කුලියකට බැඳ තබයි. මේ සම්ප්‍රදායික රටාව තිබිය හැකි ආකාර ගණනාවක් ඇත්තේ ය. නින්දගම් ඉන් එකකි. ආසියාතික ගම් සහ ජනපද තවත් ක්‍රමයකි. ගැමි සමූහ ක්‍රම තව එකකි, වහල් ක්‍රමය තව එකකි. මේ සියල්ලම ආර්ථිකය සීමා බන්ධනයකට යට කරයි. ගැමියන්ගේ නිදහස් ශ්‍රම චලනය මෙන්ම ද්‍රව්‍ය හුවමාරුවද සීමා කර තබයි. මෙය පුපුරා බිඳ දැමීම ප්‍රජාතන්ත්‍රීය වැඩ කොටසකි.

සමහර විට මෙය ඉහලින් සිදු විය හැකිය. එනම් මහා ඉඩම් හිමියන් විසින්ම ගැමියන් මුදා පලවා හැර නව ක්‍රම වලට ඉඩම් යොදා ගැන්මට ක්‍රියා කිරීම විය හැකිය. බ්‍රිතාන්‍යයේ එක්තරා දුරකට සිදු වූයේ එයයි. ඇමරිකාවේ දී සුළු ඉඩම් හිමි රතු ඉංදියානුවන් පලවා හැරීම මගින් මහා පරිමාණ ධනපති වගාවන් හා සත්ත්ව පාලනයන් ට ඉඩ ලබා ගත්හ. කොටසක් වහල් ශ්‍රමයටද යොදා ගත්හ. ඒ නවීන ක්‍රමයේ වහල් ක්‍රමයක් විය. එසේ නැතිව පැරණි වහල් ක්‍රමයම ලෙසට සැලකීම වැරදිය. වඩා ආසන්න වූයේ කුරිරු ධනපති පාලනයකටය.

ප්‍රංශයේ අද ගොවීන් විසින් ඉඩම් හිමි වංශාධිපතින් පලවා හැර ඉඩම් අල්වා ගත්හ. එනිසා ඇති වූයේ සුළු ධනපති ගොවීන්ය. මොවුන් නැපෝලියන් යටතේ වර්ධනය වූ අතර කොටසක් මහා ධනපති ගොවින් බවට පෙරලී ගියහ. අනෙක් කොටස් කඩා වැටී නිර්ධන පංතියට ගලා ගියේ ය. ලංකාව වැනි රටක ගැමි විප්ලවය ඉහලින් හා පහලින් ගමන් ගනී. වාණිජ වැවිලි සඳහා ඉඩම් ඒකාරාශී කිරීම් ඉහලින් සිදුවන්නකි. නමුත් අද මෙතැන සැබෑ විප්ලවීය බලවේගය වන්නේ පහලින් පැන නගින්නා වූ ඉඩම් ඉල්ලා සිටින බලවේග යයි. නැතිනම් රැකියා ඉල්ලා සිටින තරුණ බලවේගයයි.

'දියුණු' රටවල් වලට දියුණුව ආවේ වෙනත් ග්‍රහලෝකයකින් හෝ දේවාශීර්වාදයෙකින් නොවේ.

භූමියෙන් නිසි ඵලදාව ලබා, එහි අතිරික්තය විසුරුවා නොහැර ප්‍රාග්ධනයක් බවට හරවා ආයෝජනය කිරීමෙන් ය. ඒ ආයෝජන භූමියෙන් හා සත්ත්ව ගොවිපලෙන්, මුහුදෙන් හා විල් පොකුණු ජල මාර්ග ආශ්‍රිත ධීවර කර්මාන්තයන් ආදී කර්මාන්ත වූයේ ය. විවිධාකාර වූ නූල් වර්ග කැටීම, විවිධ පන්නයේ රෙදි රෙදි විවීම ආශ්‍රිත කර්මාන්තයන් ය. අද දක්නට ඇති මහා සංකීර්ණ තාක්ෂණයෙන් පිරිපුන් නිෂ්පාදනායතන, එම කෘෂිකර්මාන්තය අදාල ප්‍රාථමික කර්මාන්තයන්ගේ අතිරික්තය විද්‍යා හා තාක්ෂණ දියුණුවටත් වෙන් කිරිම මගින් අත් පත් කරගත් දැයයි.

මේ කාර්මික නිෂ්පාදනයන්ගේ අතිමහත් වෘධිය ඒ ඒ දේශයන් තුළ රඳවාගත හැක්කක් නොවී ය. ඒ අනුව මේ දියුණු ජාතීන් වෙළඳපලවල්, අමු ද්‍රව්‍ය භූමි සොයා කාලතුවක්කු සවි කරන ලද නැව් වලින් ලොව පුරා ගමන් ගත්තෝ ලංකාවටත් පැමිණියේ ය. එම අවශ්‍යතාවන්ගේ සීමාවන් ඉක්මවා නිශ්පාදනය දියුණු වීමත් සමඟ වෙළඳපලවල් පමණක් නොව ආයෝජන කලාපද අවශ්‍ය විය. ඒ ආයෝජන සමඟ ශ්‍රම වෙළඳපලක් ගොඩ නැගෙමින් ධනපති නිෂ්පාදන සබඳතා ලොව පුරා පැතිර ගියේ ය.

නමුත් ඉහත දක්වා ඇති පරිදි සීමිත ක්ෂේත්‍රයක ධනපති නිෂ්පාදන සබඳතා විනා, පරිපූර්ණ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රීය විප්ලවය ඔවුන් රැගෙන ආවේ නැත. ඒ වෙනුවට දේශපාලන හේතු මත ග් රාමීය ආර්ථිකයේ පූර්ව ධනවාදී නිෂ්පාදන සබඳතා එසේම තිබෙන්නට හැරි බවත්; පසුකාලීනව රට බාරගත් දේශීය පාලකයන් ද ඒ දේශපාලන පිළිවෙතම ගෙන ගිය බවත් ඉහත දක්වා ඇත.

ඒ අනුව කළ යුතු සමාජීය ප්‍රතිසංස්කරණ නොතකා, හුදෙක් තාක්ෂණික ප්‍රතිසංස්කරණ ප්‍රමාණයක් හඳුන්වා දෙන ලදී. එනම් ඉහළ ඵළදාවක් ගෙන දෙන බිත්තර වී හා වෙනත් ධාන්‍ය බීජ වර්ග හා එළවළු, පළතුරු බීජ වර්ග භාවිතය, නවීන ධීවර බෝට්ටු, දැල් හා වෙනත් නවින තාක්ෂණික ක්‍රම භාවිතය යනාදී අංශ වලට පමණක් ඒවා සීමා විය.

නමුත් කෘෂිකර්ම අංශයේ වර්ධනයට පැවැති ප්‍රධාන බාධාව වූයේ ග්‍රාමීය සමාජ සම්බන්ධතාවයන් ය. ක්ෂේත්‍රයේ සමාජ සම්බන්ධතාවන්ගේ දුරදිග යන පෙරලියක් ඇති නොකර කෙරෙන තාක්ෂණික නවීකරණ ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලය වූයේ ග්‍රාමීය දුගී බව හා සමාජ ආර්ථික අමාරුකම් තව දුරටත් බරපතල වීම පමණක් ය.

නිශ්පාදන ක්‍රමයේ විප්ලවීය පරිවර්තනයන් නො කෙරුණ ද ධනේශ්වර දේපල සම්බන්ධතාවයන්හි පැතිරීම, මුදල් භාවිතය, වෙළඳාම, උකස් ක්‍රම වැනි අංගෝපාංග පැරණි ගැමි ආර්ථිකය කඩා ඉහිරවා ලූයේ ය.

නිෂ්පාදන ක්‍රමයේ විප්ලවීය පරිවර්තනයන්ගෙන් තොර ව ඇතිවූ මෙම වෙනස්කම් ජනිත කරන ලද්දේ කුමක් ද?

විරක්ෂාභාවය, අර්ධ සේවා නියුක්තිය, ණය ගැතිකම, දුගී බව, නඩු හබ වැනි දෑ ය. ගම්බදව වැඩිවෙන ජනගහනය උරාගැනීමට සුදුසු ආර්ථික පරිවර්තනයන් වී තිබුනේ නැත. ගම්මාන වලින් පිටස්තරව

ඔවුන්ට ලැබී ඇති තැනක් ද නැත. පසුගිය අවුරුදු 70 ක පමණ කාලය තුළ අධ්‍යාපනය පැතිරීම සමඟ ග්‍රාමීය තරුණ පරපුර ලඟා කරගත් සංස්කෘතික මට්ටම, යල් පැනගිය ගැමි නිෂ්පාදන ක්‍රමය සමඟ පරස්පරව සිටින්නේ ය. වී, එළවළු ආදී නිෂ්පාදන අංශයට පමණක් නොව හස්තකර්මාන්ත, ධීවර කර්මාන්ත වැනි අංශ වලට ද මෙම ලක්ෂණය පොදු වන්නේ ය. අලුතින් නිර්මාණය වුනු වැව්-වාරිමාර්ග පදනම් කරගෙන නව ගොවි ජනපද, පැරණි ගම් ලෙසට හෝ ගොඩ මඩ ලෙසට හෝ තෙත් හා වියලි කලාප ලෙස හෝ බෙදා විවිධත්වයෙන් කල්පනා කළත්, කෘෂි අංශයේ පොදු ප්‍රශ්න එසේම පවතින්නේ ක්ෂේත්‍රයේ අතිරික්තය යලිත් ක්ෂේත්‍රයේම වෘධිය සඳහා ආයෝජනයට යොමු නොවන නිසාය.

ඒ සඳහා අවශ්‍ය තීන්දු ගැනීමේ බලයක් කෘෂි-කාර්මිකයාට නැත. නිෂ්පාදනය හා බෙදාහැරීම හා වෙළෙඳපල පාලනය කරන්නෝ ඔවුහු නොවෙති. ඒ වෙනුවට ගැමි සමාජයේ ආධිපත්‍යය ඉඩම් හිමියන්ගේ සහ වෙළඳ හා උගස්කර ප්‍රාග්ධනයේ ආධිපත්‍යය යටතේ පවතී.

ගමට ඇතුල්වන සියළු රාජ්‍ය නිලධාරීහු මෙම ආධිපත්‍යයේ කොටස් කරුවෝ වෙති. බොහෝ විට ගැමි සමාජයේ ඉඩම් අයිතිකාරයාත්, වෙළෙන්දාත්, ණය දෙන්නාත් එක් කෙනෙක් ය. ගමත් නගරයත් අතර වූ මැදි මට්ටමේ සූරාකන්නන් මොවුහු ය.

රජය සහ ආණ්ඩුවේ ආයතන පද්ධතිය ක්‍රියාත්මක වන්නේ දුගී ගැමි ජනතාවගේ ආධාරකරුවන් හැටියට නො වේ. රජය හා ආණ්ඩුවේ කන්තෝරු, මූල්‍යායතන දුගී ගැමි ජනතාව කනස්සන්ලට පත් කරන කරදර ඇති කරමින් සිටිති. ඉහත දැක්වූ සූරාකන්නන්ට ආධාරයක් ලෙස ආණ්ඩුවේ කන්තෝරු ක්‍රියා කරයි. වගා නිලධාරීන්, සමූපකාරය ආදී සෑම ආයතනයකම ගැමි සමාජයේ ඉහල තීරුවේ උවමනාවන්ට අනුව හැඩ ගස්සා ඇත. පොලිසිය හා උසාවිය ගැමි ජනතාව පීඩනයට පත් කරන, ඔවුන්ගේ ජීවිත නගර වල උසාවි ගානේ නිරන්තර ව රස්තියාදු කරවන ආයතනයන් හැටියට පවතින්නේ ය.

ගැමි ඉඩම් කැබලිකර නිසරු වෙයි. ණය වූ දුගී ගැමියා සැලසුම් නැති යැපුම් ආර්තිකයකට තව තවත් යටවෙයි. රැකියා නැති තරුණයා දුකින් තැවෙයි. ඉහත දැක්වූ අසංවිධිත බවට පත්ව තනි තනි ඒකක ලෙස බිඳ විසුරුවනු ලැබ ඇති දස දහසකුත් එකක් වූ ගම්මාන වල වැසියන්, තමන්ගේ පාරම්පරික යැපුම් මාර්ගයන් අහිමි කරමින් ගල් රෝලක් සේ ගමන් කරන රාජ්‍ය අනුග්‍රහය ලත් සූරාකන්නන් දෙස මුමුණමින් බලා සිටීමේ ඉරණමට මුහුණපා සිටී.

තමන්ගේ පාරම්පරික යැපුම් මාර්ගයන් අහිමි ව යන අන්දම දැකීම කොතරම් ශෝකජනක වුව ද, මෙම වාම් ග්‍රාමීය ජන කොට්ඨාශයන් හැමවිටක ම අතීත රජවරුන්ගේ ආඥාදායකත්වයේ තිරසර පදනම වූ බව අමතක නොකළ යුතුය. අදත් අසහාය බලයේ පදනම ගමමය. මිත්‍යා විශ්වාසයන්ට ප් රතිරෝධය නො පාන්නාවූ උපකරණයක් බවට මිනිස් මනස පත් කරමින් ද, සම්ප්‍රදායික රීතින්ට අනුව මිනිස් මනස වහල්භාවයට පත් කරමින් ද ගම් ක්‍රමය කුඩා චක්‍රයක් ඇතුලත මිනිස් මනස හිර කරයි. සුදු පාලකයන් සේම දුඹුරු පාලකයන්ද මේ ගම තමන්ගේ බෙදා පාලනය කිරීමේ උපක්‍රම සඳහා යොදා ගැනීමට හැකියාව ලද්දේ මේ තතු තුලය.

මේ අසාර ග්‍රාමීය ආර්ථිකයට නව ශ්‍රමය උරාගැනීමට තරම් විකාශනයක් ඇති කරගත හැකි නොවීය. ඒ නිසා සමාජ සබඳතාවන්ගෙන් පිටස්තර වූවන් බවට පත් ගැමි තරුණ තරුණියන් රජයට එරෙහිව කැරළි ගැසූහ. පළමුව දකුණින් වර්ධනය වූ කැරළිකාරීත්වය සමකාලීනවම උතුරු-නැගෙනහිර ද වර්ධනය විය. උතුරු-නැගෙනහිර තරුණපෙළ අතර කැරළි වඩාත් බලවත්, දිගට ඇදී යන කැරළිකාරීත්වයක් බවට පත් වූයේ ජාතික විමුක්තිය පිළිබඳ ප්‍රශ්නයද පොදු ප්‍රශ්ණ සමඟ බැඳී පැවති නිසාය. රටේ තරුණ පෙළට සමාජයට ඇතුල් වීමට අවස්ථාව සැලසීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ

කිරීමට අසමත් පාලකයන්, ඒ වෙනුවට දකුණේ සිංහල බහුතරයට වැඩි ඉඩකඩක් සැලසීම සඳහා ජාතිවාදී පදනමක් මත ඉදිරිපත් කළ (ජාතින් පදනම් කරගත් උසස් අධ්‍යාපනය සඳහා ඉදිරිපත් කළ ප්‍රමිතිකරණයන් හා රැකියා දීමේ දී ආණ්ඩුපක්ෂ මන්ත්‍රී වරුන්ගේ ලැයිස්තු වලට ප්‍රමුඛත්වය දීම ආදී පිලිවෙත්) දෙමළ තරුණ පෙළ අතර රටේ පාලනය පිළිබඳ වෛරය තවත් උත්සන්න කළේය.

**අසාධයට වැටක් ගැන අදහසක්**

නිෂ්පාදනය කිරීමේ අයිතිය පමණක් ගැමි ගොවියා සතු අතර, ඒවායේ වෙළඳපළ, බෙදාහැරීම හා ගබඩා සියල්ල ප්‍රාග්ධන හිමියාගේ ආධිපත්‍ය තුල පවතී.

ඒ අනුව අස්වනු නෙලන කාලයේ දී තුට්ටු දෙකට ඒවා ගන්නා මේ බලවතුන් එමෙන් කිහිප ගුණයක් ලාබ ගනිමින් තොග/සිල්ලර මිල ගණන් නියම කරති. මේ අධි ලාබයෙන් කොටසක් දේශපාලන බලවතුන් සතුවෙයි. රජයේ පාලන මිල ක්‍රම එදා මෙදා තුර වෙළඳපල මිල තීරණයේ දී කිසිම වැදගත් බලපෑමක් භාණ්ඩ මිලට කළේ නැත. මිල තීරණය කිරීමේ ශක්තිය ක්ෂේත්‍රයේ බලවතුන්ට ලැබෙන පරිදි උපක්‍රම යෙදීම, මේ බලවතුන් හා රාජ්‍ය නිලධාරීන්ගේ කජීපයාධිපත්‍යයකින් සිදු කෙරෙයි.

විශේෂයෙන් පළතුරු හා එළවලු මිලට ගන්නා ගිවිසුම්, ගොවියන් හා වටිනාකම් එකතුකිරීමේ නිෂ්පාදනයන් හි යෙදෙන සමාගම් අතර ඇත්තේ වුවද, මේවා ඉතා අඩු ප්‍රතිශතයක් ගනී. ඒ අනුව, බොහෝ විට අමතර එළවළු අස්වනු විසි කර දැමීමට ගොවියාට සිදුවෙයි. මෙහි අමතර යන්නෙහි අරුත ඒවා පාරිභෝජනයට ගැනීමට තරම් ජනගහනයක් රටේ නැති බව නොවේ. 'සැපයුම වැඩි වීම' නිසා වෙළඳපලේ නියම වන මිල නිෂ්පාදන වියදමටත් වඩා බොහෝ අඩු වීම නිසාය.

ඒ අනුව මේ ප්‍රාග්ධන හිමියන්ගේ ඒකාධිකාරය බිඳ හෙලන, ගම් කිහිපයක් ඒකාබද්ධ කර ගොඩ නඟන ගොවි අධිකාරයන් (ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් මත සැබෑ කෘෂිකාර්මිකයන්ගේ ඡන්දයෙන් පත්වන) රට පුරා ගොඩ නැගිය යුතු අතර, ඒ අධිකාරයන්ගේ පාලනයට යටත්ව; කල් තබා ගැනීමේ අවශ්‍යතා සපුරා ඇති ගබඩා පහසුකම්, ශීතාගාර පහසුකම්, හා වටිනාකම් එකතු කිරීමේ කුඩා කර්මාන්ත ශාලා බිහි කළ යුතුය. ඒ මගින් අවස්වනු නෙලන කාලයන් හි දී ත් මිල බිංදුවට වැටෙන්නට නොදී, සුදුසු මිලක් රැකෙන පරිදි නිෂ්පාදන මේ ගබඩා වලින් ක්‍රමිකව නිකුත් කිරීමට අවස්ථාව සැලසේ. කුඩා ග්‍රාමීය කම්හල් මගින් දුගී පාරිභෝගිකයන්ටත් මිලදී ගත හැකි අයුරු නිමි ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කර වෙළඳපලට නිකුත් කළ හැකිය. ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් මෙන්ම ග්‍රාමීය ගෘහ කර්මාන්ත සම්බන්ධයෙන් ද මේ පිලිවෙත ඉතාමත් සුදුසු ය.

මේ සඳහා අවශ්‍ය වන්නේ තීන්දු ගැනීමයි. ආර්ථික විශේෂඥයන් පවා කොම්පැනි ක්‍රමය තුළ කල්පනා කරනවා විනා ප්‍රජාතන්ත්‍රීය මහජන ආයතන මත කල්පනා නොකරයි. කළ යුත්තේ මෙවන් වූ විප්ලවකාරී වෙනසක් ගමට ගෙනයෑමයි. එමගින් නිෂ්පාදනයට ලැබිය යුතු වෙළඳ මිල පමණක් නොව ග්‍රාමීය අංශයේ රැකියා උත්පාදනයත්, ආදායම් මාර්ග ඉහල යෑමත් සිදුවෙයි. අවශ්‍ය මූලික ප්‍රාග්ධනය (ගබඩා ක්‍රම හා ශීතාගාර සැකසීම හා කුඩා කර්මාන්ත ශාලා ගොඩ නැගීම සඳහා) රජයෙන් හෝ රාජ්‍ය බැංකු මගින් සැකසිය යුතු අතර, ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සිටින වැඩ නැති නිලධාරීන්ට නිසි පුහුණුවක් ලබා දී මෙම ගොවි අධිකාරයන්ට අවශ්‍ය උපදෙස් හා තාක්ෂණික දැනුම ගෙන යෑමට ක්‍රියා කළ යුතුය. මේ පිලිවෙත් කඩාකප්පල් කිරීමට ගම් වල 'අසහාය බලකරුවන්' ඔවුන්ගේ අන්තේවාසිකයන් සමග ඉදිරිපත් වනු ඇත. එවැනි ප්‍රතිගාමී බලවේග හිස එසවීම වැලැක්වීම සඳහා අවශ්‍ය විටක ඔවුන්ගේ ගබඩා/කම්හල් ගැමි අධිකාරියේ පාලනයට යටත් කිරීමේ අනපනත් සම්මත කළ යුතුය.

**<u>3. ජාතික එක්සත් භාවය :-</u>** රාජධානියක විවිධ භාෂා හා සම්ප්‍රදායික ජනතා කොටස් සිටිති. එසේම එකම භාෂා හා සම්ප්‍රදායයන් ඇති ජන කොටස් විවිධ රාජධානි වලට බෙදී සිටියි. මේ දෙකම

ජනයාගේ සමීප භුවමාරුවට බාධාවන් ය. භාණ්ඩ වෙළඳපොලට බාධාවන්ය. මේ නිසා ඉතාම පළල් මෙන්ම සෑම ජන කොටසකගේම ඍජු මැදහත්වීම වැඩිවන නව ඒකකයක් අවශ්‍ය වේ. ස්ව පාලනය හා ජාතික එක්සත්කම එහි ප්‍රතිඵලයයි. මේ නිසාම පොදුකම රැකගැන්ම මෙන්ම විවිධත්වය රැක ගැන්මද, එමගින් වැසියන්ගේ අන්‍යෝන්‍ය සහයෝගීතාවයේ හා දැනුම් ලැබීමේ පදනම් වර්ධනය කර ගැන්මද අවශ්‍ය වන්නේ ය.

තවමත් අප වැනි රට වල ජාතින්ගේ නිදහස ලැබී නැත. ලංකාව ගත් කල, දෙමළ ජනයාගේ විමුක්ති සටන එනිසාම හරයෙන්ම ප්‍රගතිශීලී ය. එහි ප්‍රතිගාමීත්වය ඇත්තේ මතුපිට පමණය. එසේම සිංහල සුළු ධනේශ්වරය තුළ ද ගෝලීය ධනවාදයට විරුද්ධ විමුක්තිකාමයක් ඇත. එය ද ප්‍රගතිශීලීය. ජාතිවාදය ඇත්තේ මතුපිටය. මෙයට හේතුව දෙමළ ජනතාවගේ පමණක් නොව සිංහල ජාතිය තුළත් මේ ජාතික අයිතිය පිළිබඳ ප්‍රශ්නයේ වැදගත් කොටසක් නොවිසඳී ඉතිරිව ඇති හෙයිනි. පසුගිය දශක හත තුළ සිංහල විමුක්ති සටන යම් දුරක් ගොස් ඇත. තම ඉරණම පිලිබඳව තීරණ ගැනීමේ හැකියාව පළල් වශයෙන් ගත් කල, සිංහලයාගේ පැත්තෙන් ඉහල ගොස් ඇත. එනිසා මෙන්ම මහ ජාතිය වීමත් නිසා, එම විමුක්තිවාදය දෙස අපි බැලිය යුත්තේ වඩා පරිස්සමිනි.

දෙමළ විමුක්තිය ගෝලීය ධනවාදයේ පීඩනයට අමතරව සිංහල බහුතරයේ පීඩනයටත් ලක් වන නිසා, එයට වැඩිමනත් බැරෑරුම් වූ අතුරු ප්‍රශ්නයකි. තම ඉරණම පිළිබඳව තීන්දු ගැනීමේ අයිතිය මුළුමණින්ම මහ ජාතිය මගින් හරස් කර තිබේ. එනිසා දෙමළ ස්වපාලනය ස්වයංතීරණය දක්වා වන දිගුවක් වීම ස්වාභාවික හා වැලැක්විය නොහැක්කක් වන්නේ ය. ඇමරිකාවේ කළු ජාතිකයින් වෙනම රටක් වෙනුවෙන් දෙවන ලෝක යුද්ධය වන තෙක්ම හඬ නැගුහ. එනිසා ලින්කන්ගේ සිවිල් යුද්ධයෙන් ද නොවිසඳුනු ජාතික ප්‍රශ්නයක් ඉතිරිවී තිබින. එහෙත් අද වන විට එහි හරයෙන් විප්ලවවාදී බවක් නැත. එය එනිසා අවශේෂ ප්‍රශ්නයකි. වර්තමාන ලෝක තත්ත්වය තුළ දියුණු ධනපති රටවල ඉතිරිවී තිබෙන ජාතික ගැටළු වලට, සමාජවාදය ගැන කතා නොකර දිය හැකි අතරතුර මැදි ප්‍රජාතන්ත්‍රීය විසඳුමක් නොමැත. උතුරු අයර්ලන්තයට ද එසේම ය.

ලංකාව වැනි අඩු දියුණු රටවල එසේ නොවේ. සමාජවාදයෙන් මෙපිට දුරදිග යන විසඳුම් ඇත. එහෙත් එම විසඳුම් ලබා දෙන්නේත් කම්කරු පංති ශක්තිය මතයි. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදීන් දෙමළ නිදහස හා ස්වපාලනය වෙනුවෙන් පෙනී සිටිය යුතුය. ඒ අතරම එම අයිතීන් ලබා ගත හැක්කේ නිර්ධන පංතියේ ඉදිරිපත්වීම මත සැකසෙන ව්‍යවස්ථා රාමුවකින් බවත්, එම විමුක්ති සටනේ සාර්ථකත්වය එසේ නිර්ධන පංතියේ ශක්තිය සමඟ එක්ව කරන අරගලයකින් පමණක් අත්පත් කරගත හැක්කක් බවත් පෙන්වා දෙමින් ම ය. ඒ අතර ඇතිවන සෑම සටනක්ම මර්ධනයෙන් බේරා ගැනීමට ඉදිරිපත් වෙමු. එක් අතකින් මෙම සටන් ඒ අකාරයටම වර්ධනය විය යුතුය. අනෙක් අතට එම සටන නිර්ධන පංති අරගලය සමග සම්බන්ධ කළ යුතුය.

නමුත් ඒ වෙනුවට බොහෝ'සමාජවාදීන්' දෙමළ විමුක්ති අරගලය පංති අරගලයට බාධාවක් ලෙස සැලකීය. එය ප්‍රතිගාමී බලවේග වලට හා මර්ධන නීති සැකසීමට මං විවර කරදෙන ''ෆැසිස්ට්'' පන්නයේ නායකත්වයකින් දියත්වන්නක් ලෙස හඬ නැගිනි. සත්‍ය හෙළිවීමට කල් ගත නොවීය. ජන ඝාතක සිවිල් යුද්ධයත්, ඒ මගින් ජනිත කල අත්තනෝමතික රාජ්‍ය බලයත්, ''අසහාය බලය'' ක්‍රියාත්මක වීමේ තවත් ආකාරයක් වත්මනේ දී රට ඉදිරියේ මතු කළේ ය. මේ අසහාය බලයෙන් නිදහස ලැබීමට උතුර සිට දකුණට ප්‍රජාතන්ත්‍රීය බලවේගයන් අවදිවී ජයග්‍රහනයක් ලැබුවද; එම ජයග්‍රහනය දරාගෙන ඉදිරියට යාමට තරම් එම බලවේගයන් ස්ථාවර වූයේ නැත. ඒ අසාර තත්ත්වය යොදා ගනිමින් අසහාය බලය යලි බලයට ආවේ සිංහල බෞද්ධ ජාතිවාදය යලිත් කුප්පවනු ලැබීම මගින් ම ය.

නමුත් ඉක්මණින්ම දහසක් පැලැස්තර අලවා සිදුරු වසා ගෙන පැවැති ආර්ථික බැලුමේ ණය නැමැති පැලැස්තරය ගැලවී යැමත් සමඟ, සිංහල බෞද්ධ අසහාය බලය කිලිපොලවන හඬක් නංවමින් හුලං බැස ගියේ; මහ පොලවට පතිත විය.

සියළුම ජාතීන් නිදහස සමානාත්මතාවය හා ස්වපාලනය මත එක්සත් කිරීම සංවර්ධනයේ වැදගත් ම ස්ථම්භයයි. රටක ජනතාවක් එකාවන්ව නිෂ්පාදනයේ යෙදෙමින් ඒ අත්දැකීම් මත නිෂ්පාදනයන් ප්‍රමාණයෙන් හා ගුණයෙන් ඉහල නිෂ්පාදන බවට පත් කරගනිමින් යන්නේ නැති සමාජයක කුමන දියුණුවක් ද? ජාතියේ එක්සත් කමට වඩා දෙමළාට විරුද්ධව සිංහලකම අවදිකිරීම බල ව්‍යාපෘතිය කරගත් මේ රට, මෙතෙක් පැවතීම ම ඇතිය.

මෙහි දී අමතක නොකළ යුතු කරුණක් ඇත. එනම් ධනපති ක්‍රමය පුළුල් කර, ශක්තිමත් සංවර්ධන මාවතකට ඇතුල් කිරීමට වෑයම් කළ ලාංකීය ජනතාවාදී දේශපාලනයේ මූලාරම්භක වකවානුවයි. එහි දී දෙමළ ජනතාව සංවර්ධනය සඳහා ඇතුල් කර ගැනීමේ අවශ්‍යතාවය මතු වීම අනිවාර්ය විය. බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම මෙන්ම ඩඩ්ලි-චෙල්වනායගම් ගිවිසුමත් ඒ දිසාවෙන් මතු වූ යුගයේ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රීය එකඟතාවයන් විය.

විශේෂයෙන් ආර්ථික වෘධියට අත්‍යාවශ්‍ය නියම කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණයන් තහවුරු කිරීම සඳහා මේ ප්‍රජාතන්ත්‍රීය දේශපාලන එකඟතාවයන් අත්‍යාවශ්‍ය බව තේරුම් ගත් මේ ධනපති පංති නායකයන් ඒ සඳහා වන ප්‍රාථමික එකඟතාවයක් සඳහා මේ ගිවිසුම් වලට එළඹි බව පැහැදිළි ය. නමුත් පසුගාමී ගැමි ආර්ථික සබඳතා පදනම් කරගත් සිංහල බෞද්ධ අසහාය බලය මේ ගිවිසුම් වලට එරෙහිව කැරලිගසා නැගී සිට, ඒවා ක්‍රියාවටලීම වළකාලන ලදී. බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමට එරෙහි කැරළිකාරීත්වයට විරුද්ධව ගිවිසුමට සහයෝගය දීමට ඉදිරිපත් නොවූ ලාංකීය සමාජවාදීන්, ඩඩ්ලි-චෙල්වනායගම් ගිවිසුමට එරෙහිව සිංහල බෞද්ධ අසහාය බලය සමඟ පෙළපාලි වලට එක්වූහ. මෙය ලාංකීය සමාජවාදී ව්‍යාපාරයට නොමැකෙන අවමානයක් ගෙන ආවේ ය. මේ තතු යටතේ, ලංකාවේ ජාතික විමුක්ති අරගලය ‘වෙන්වීමේ’ අරගලයක් ලෙස සිවිල් යුද්ධයක් දක්වා වර්ධනය වී ගියේ ය.

සිවිල් යුද්ධය මධ්‍යයේත් දේශපාලන එකඟතාවයක් සඳහා පූර්ව සූදානමක් ලෙස ඇතිකරගත් රනිල්-ප්‍රභාකරන් සටන් විරාම ගිවිසුම මෙන්ම, එහි ම දිගුවක් වූ ඒකාබද්ධ සුනාමි යාන්ත්‍රණය වැනි වැදගත් සම්මුතීන් ප්‍රතිගාමී බලවේගයන්ගේ කුමන්ත්‍රණ තුලින් යටපත් කර දැමිණි. අවසානයේ සිවිල් යුද්ධයක් ලෙස වර්ධනය වූ දෙමළ විමුක්ති අරගලයේ සන්නද්ධ ක්‍රියාකාරීත්වය, ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ ජාත්‍යන්තර “ත්‍රස්තවාදයට එරෙහි අරගලයේ” පිටුබලයෙන් පරාජය කළ බව සැබෑ මුත්, ප්‍රශ්නය වඩාත් බැරෑරුම් ලෙස වර්ධනය වී පවතින්නේ මේ ජනඝාතක සිවිල් යුද්ධය විසින් දෙමළ ජනතාව මත පතිත කළ අළුත් පීඩාකාරීත්වයන් රාශියක් මධ්‍යයේ ය.

**මර්දන නීති -** මෙසේ ප්‍රජාතන්ත්‍රීය විසඳුම් වලක්වාලන ලද්දේ වී මුත් මර්දන නීති නම් හොඳින් ආරක්ෂා විය. දිනෙන් දින ඒවා සංවර්ධන වූයේ ය. මේ මර්දන නීති ජනතාගේ ප්‍රශ්න වලට විසඳුමක් නොවන නිසා, සමාජ අරගලයට විසඳුමක් ද නොවේ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී පිලිවෙත් මගින් ජනවගේ බහුතරය වන ඇත්ත නිෂ්පාදකයන්ට, කම්කරුවන්ට සහ ගොවියටන්ට ක්‍රියාකාරීව මැදහත්විය හැකි, තීරණ ගත හැකි සහ ඒවා ක්‍රියාත්මක කළ හැකි ශක්තිමත් බලයක පැවැත්ම, සමාජ ආර්ථික පෙරලියක පූර්ව කොන්දේසියක් ලෙස සලකා කටයුතු කළ යුතුය. අපහසුතාවයන් ජය ගැනීම සඳහා ක්‍රියාත්මක විමට ජනතාවට අවස්ථාව තිබිය යුතුය.

මර්දන නීති මෙවන් ප්‍රජාතන්ත්‍රීය පිලිවෙතකට හරස්ව පිහිටන්නේය. එය සමාජයේ පංතීන් අතර තිබිය යුතු සංවාදය කඩාකප්පල් කරයි. නිෂ්පාදකයා හා වැඩකරන ජනතාව අතර සාමූහික කේවල්

කිරීමේ පදනම විනාශ කරයි. එපමණකට සංවර්ධන ක්‍රියාවලියට සහායක් නොව, අවාසියක්ම ඇති කරයි.

ඒ නිසා සමාජ, ආර්ථික ප්‍රගතියේ ප්‍රාථමික අවශ්‍යතාවයක් වන්නේ මේ රටේ ප්‍රතිගාමී බලවේග නිරන්තරයෙන් යොදා ගත් බලහත්කාරය, අදහස් - ජීවිත විනාශයන් මගින් යටපත් කිරීමට ක්‍රියා කිරීම්, බහුතරයේ බලය යොදා අඩුතර ජනතාවගේ පාරම්පරික භූමීන් හා වෙළඳපළ කොල්ලකා ගැනීම් අවසන් කිරීමයි.

මේ මර්දන නීති, බලහත්කාරී තිරශ්චීන සමාජ බලවේගයන්ගේ උවමනා අනුව ගන්නා පාපී ක්‍රියාමාර්ග ආරක්ෂා කිරීමට වැදගත් වනවා වෙන්නට පුළුවන. නමුත් සාමාන්‍ය ජනතාවට නම් මේවායින් සෙතක් නොවූ අතර, වන්නේ ද නැත.

ඒ අනුව අද නිතර කථා කරන ත්‍රස්ත පනත ඇතුළුව සියළුම මර්දන පනත් නීති විරෝධීකර අහෝසි කළ යුතුය. ඒ සමඟ එම නීති යටතේ අත්අඩංගුවේ රඳවාගෙන සිටින හා දඬුවම් ලබා සිටින්නවුන් කොන්දේසි විරහිතව නිදහස් කළ යුතුය. ඔවුන් සම්බන්ධ සිවිල් නඩු පැවරීමට අවශ්‍ය නම් ඒ සඳහා මුල සිට කටයුතු ඇරඹිය යුතුය.

මේ මර්දන අණපනත් වෙනුවට, කිසිම මර්ධන පනතක් ගෙන නොඒම රටේ ප්‍රඥප්තිය විය යුතුය.

ලංකාවේ යුධ හා ආර්ථික අපරාධ කරුවන්ට දඬුවම් දීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම කරන අරගලය ගැන සමහරු කලබලයට පත්ව සිටී. නමුත් මේ උදවියම මේ ඊනියා ජාත්‍යන්තර ප්‍රඥප්තීන් අනුව නව ත්‍රස්ත පනතක් ගෙන ඒමට ක්‍රියා කිරීම කබරගොයා-තලගොයා කතාව සිහිපත් කරවන්නකි.

සමාජයට අපරාධ කරන්නවුන්ට දඬුවම් දීමට ඒ සඳහා තිබෙන දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති යොදා ගනිමින් නිසිලෙස අධිකරණ මගින් තීන්දු ගැනීම කළ හැකිය. මේ අපරාධයන් විද්‍යා-තාක්ෂණ දියුණුව හා සමාජයේ වෙනස් කම් සමඟ අලුත් අලුත් ස්වරූපයන්ගෙන් පෙනී සිටීමට ඉඩ ඇත. ඒ සඳහා අවශ්‍ය නව නීති කටයුතු වේ නම්, ඒවා වෙනුවෙන් කටයුතු සම්පාදනය කර අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට විනිෂ්චයකරුවන් - නීතිවේදීන් - මානව හිමිකම් ක්‍රියාධරයන් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත වන්නා වූ, නියමිත කාල වකවානු අනුව රැස්වන ස්ථිර සභාවක් ඇති කළ යුතුය. පනතක් අවශ්‍ය වන්නේ එවැනි සභාවක තීරණ වලට ශක්තියක් ලබා දීමට විනා මර්දනය සඳහා නොවේ.

අද ලංකාවට අවශ්‍ය වන්නේ ත්‍රස්තවාදයට එරෙහි අනපනත් සෑදීම නොව, මෙවැනි ප්‍රජාතන්ත්‍රවාදී නොවන දේශපාන ක්‍රියාකාරීත්වයන් ඇතිවීමට හේතුවන තත්ත්වයන් ඇති වීම වැලැක්වීමට අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ආර්ථික අන පනත් සැකසීමය.

**<u>4. සැබෑ නියෝජිතයන්ගේ ආණ්ඩුවක් :-</u>** ධනපති පාලනයේ මූලික අංගය නැතිනම් හරය වූයේ නගර සභාවයි. පාර්ලිමේන්තුව වර්ධනය වන්නේ ධනපති රාජ්‍ය ප්‍රතිසංස්කරණයන් තුළය. නගර සභාව හා ගම් සභාව ප්‍රදේශබද අසහාය බලයේ පැරණි පාලන රටාව මුළු මනින්ම පිස දැමුවේ ය. එනිසා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ හරය, ධනපති විප්ලවයේ දී ද පාර්ලිමේන්තුවට වඩා ජනතාවට සමීපවූ එකක් විය. එනිසාම නගර සභා හා ගම් සභා ඇතුළු මුළු නියෝජන රටාව ජනතා ස්වපාලනයේ කොටසක් ලෙස ඉස්මතු විය යුතු බව ගැන කථා නොකර, ඡන්ද ගැන කථා කිරීම අමූලික බොරුවක් වේ.

නිර්ධන පංතියේ ශක්තිය උකහා ගනිමින් සම්මත කෙරුණු 13 වන ව්‍යවස්ථා සංශෝධනය, සියළු තාක්ෂණික දුබලතා එසේ තිබියදී මේ පදනම මත ඉදිරිපත් වූවකි. ස්වපාලනයේ ප්‍රාරම්භකත්වය ලෙස සලකා එය පරිපූර්ණ ලෙස, ඉඩම් හා පොලිස් බලතල සහිතව ක්‍රියාත්මක කළ යුතුව තිබේ. එම

ක්‍රියාත්මක භාවය තුළ පිඹීදෙන ජන බලය 13 සංශෝධනයේ ඇති අඩුපාඩු සම්බන්ධයෙන් විසඳුම් සොයා යැමට එක්සත්ව කටයුතු කිරීමට අවශ්‍ය අධිකාරයන් මතු කරගන්නවා ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය නොදකින සමාජවාදීන්, සමාජවාදය සොයා ගියේ දෙමළ විමුක්ති අරගලයට විරුද්ධව "ත්‍රස්තවාදයට විරුද්ධ යුද්ධය" යන ගෝලීය ධනවාදයේ සටන් පාඨය කරගසාගෙන ය. දැන් හොඳටම ඇතිය.

**අධිපති මතවාදයන්ගේ අවසානය**

පැවැති අධිපති මතවාදයන් රටේ ප්‍රජාතන්ත්‍රීය පරිවර්තනයන් කිරීමට ඉඩ නොසැලසීය. ප්‍රජාතන්ත් රවාදී දේශපාලන හා සමාජ/ආර්ථික පරිවර්තනයකින් තොරව සැබෑ ආර්ථික වෘධියක් ඇති කළ නොහැකි බව, වෙනත් ඕනෑම තැනකට වඩා අද ලංකාව තුළ ඔප්පු වී තිබේ.

පසුගිය වසර 70 ක් තිස්සේ මතුපිටින් ඇති වූ සියළු සමාජ-ආර්ථික ප්‍රසාරණයන් අභ්‍යන්තරයෙන් ගලා ගිය අස්ථාවරත්වය පිලිබඳ කරුණු-සංඛ්‍යා ලේඛණ හා විශ්ලේෂණ, අද බැලූ බැලූ අත දර්ශනය වෙයි. විශ්ලේෂණ දසතින්ම ඇසෙයි. ගණන් මිනුම් සංඛ්‍යා ලේඛන ප්‍රස්ථාර යොදා ගෙන ඇති වී තිබෙන තත්ත්වය පැහැදිලි කිරීම් දිනක් දිනක් පාසා පුනරුච්චාරණය වෙයි. ඒ විශ්ලේෂණ හා හෙළිදරව් කිරීම් දැන් ඉස්මුරුත්තාවටම ගොස් තිබේ. අවාසනාව වන්නේ මේ 'සංඛ්‍යා ලේඛන සංදර්ශන' විසින්, වසර 70 ක් තිස්සේ සංවර්ධන රේට්ටු ගැන කළ කී දැයේ සම්පූර්ණ පරස්පරයක් අද ප්‍රකාශයට පත් වෙමින් තිබීම යි.

මේ කිසිවකින් ප්‍රශ්නයේ මූලයන්ට එලිය විහිදුවනු නොලබ යි. මෙරට ධනපති පංතියේ පොදු අසමර්ථ භාවය ගැන ඇත්තේ සිල්ලර විවේචනයන්ය. ඥාති සංග්‍රහ, වංචා, දූෂණ මේවාට ඇතුලත්ය. ඒවා පෙන්වා දිය යුතු මෙන්ම, විශේෂයෙන් යලි සිදුවීමට ඇති ඉඩ හැකි සෑම ආකාරයකින්ම අහුරා දැමීම අවශ්‍ය වෙයි.

එහි දී සෑම රාජ්‍ය මූල්‍ය කටයුත්තක්ම සැලසුම්කරණයේ සිට අදාල මුදල් ගෙවීමේ තැන දක්වා විමර්ශනය කිරීමේ අධිකාරය සහිතව අදාල අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/මණ්ඩලයේ සේවකයින්ගෙන් සැදි සේවක කමිටුවක් සම්ප්‍රදායික ආයතන රාමුවට අමතරව පිහිටවිය යුතුය. 'මේ මුදල් වියදම අද දිනට ප්‍රමුඛතාවය ලැබිය යුතු දෙයක් ද?' යන ප්‍රශ්නයේ සිට, ඒවාට නියමිත වැය ශීර්ෂ වල ඇති අත්‍යාවශ්‍ය නොවන අතුරු වියදම් සොයා බලා කපා හැරීම, නිසි ප්‍රමිතිය, පැවැත්ම හා ඒ වියදමෙන් බලාපොරොත්තු වූ පරමාර්ථය ඉටු වන්නේ ද ආදී සෑම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ම අවධානය යොමු කිරීමට සේවක කමිටුවලට අදාල විෂයයන් වනු ඇත.

එවැනි ප්‍රජාතන්ත්‍රීය යාන්ත්‍රණයක් වෙනුවෙන් සටන් නොකර හුදු සටන් පාඨ හඬ නැගීම එල දරන්නේ නැත.

**ගැලවුම්කාර එළුවා ("Scapegoat") සොයා ගැනීම.**

දැන් මේ වන විට වචන 6000 ක් වෙත නෙත් යොමු කරමින් වැයම් කළේ වරද කරුවන් නොව, පාපය ("sin") සොයා ගැනීමටය. වරද ("guilt") යනු පාපයෙන් ජනිත වන ඵලයන් ය. මේවා පුද්ගලයාට සහ ජාතියට පීඩා කළ හැකි මානව තත්වයේ (human condition) කේන්ද්‍රීය අංග වෙයි. ඒවා සමාජය දූෂණය කර මිනිසා හා මනුෂ්‍යත්වය අතර අන්තර් ක්‍රියා වලක්වයි. පාපය සහ වරද පුද්ගලයෙකු පමණක් නොව ප්‍රජාවකට පවා සැබෑ බරක් ඇති කරයි. ඒ බර සැහැල්ලු කරගැනීම සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරන තෙක්ම ඒ බර පවතින්නේ ය.

පොදුවේ ගත් කල, පාපය යනු පුද්ගලයෙකු මත හෝ සමාජයක් මත පැටවෙන සැබෑ පැල්ලමක් හෝ බරක් ඇති කිරීමට තරම් බරපතල වරදක් ලෙස එදා සමාජය වටහාගෙන සිටියහ. පාපය හිතාමතා

හෝ නොදැනුවත්ව විය හැකි අතර, එය ක්‍රියාවක් (මිනීමැරීම වැනි) හෝ ක්‍රියා නොකිරීම (දැන සිටින අපරාධයකට සාක්ෂිකරුවෙකු ලෙස සාක්ෂි නොදීම වැනි) විය හැකිය. පාපය හේතුව වන තැන, වරද 'ඵලය' නැතිනම් පාපයක් කිරීමේ තර්කානුකූල ප්‍රතිවිපාකය ලෙස ගැනිනි.

"පාපයේ විපාක ආකාර කිහිපයකින් ප්‍රකාශ විය හැකිය. නිදසුනක් වශයෙන්, උසාවියේදී, අපරාධයකට වරදකරු වූ අයකුට ඔහුට නියම කරන ලද දඬුවම ගෙවීමට සිදු විය. බොහෝ මිනිසුන්ට ද වරදකාරී හැඟීමක් ඇති විය හැකිය, එය තමා තුළම ගැටලුවක් නොවිය හැකි නමුත් තමන් වරදක් කර ඇතැයි දන්නා බවට ඇඟවීමකි. දුක් විඳීම ද වරද පිළිගැනීමට හේතු විය හැක. හීබෲ බයිබලයේ සහ පුරාණ ආසන්න පෙරදිග ලෝකයේ, මිනිසුන් සාමාන්‍යයෙන් විශ්වාස කළේ පාපය, වරදකාරිත්වය සහ දඬුවම් යන චක්‍රය ස්වාභාවික නීතියක් ලෙස ක්‍රියාත්මක වන බවයි. පාපයක් කිරීම ස්වභාවිකවම පව්කාරයාට අහිතකර ප්‍රතිවිපාකවලට තුඩු දුන්නේය. එබැවින්, මිනිසුන් දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේ නම්, ඉන් නිගමනය වූයේ ඔවුන් යම් පාපයකට වැරදිකරුවන් විය යුතු බවයි. කෙසේ වෙතත්, විශේෂයෙන් යෝබ්ගේ පොත පාපය හා, වරදකාරිත්වය යන ඵලය සමඟ පොරබදයි, දඬුවම නිරපේක්ෂ නොවන අතර, ඇතැම් ධර්මිෂ්ඨ මිනිසුන් දුක් විඳීමටත් දුෂ්ට මිනිසුන්ට සමෘද්ධිමත් වීමටත් ඉඩ ඇත." - "Sin and Guilt in the Hebrew Bible" Michael B. Hundley (Hundley was an Alexander von Humboldt Postdoctoral Research Fellow at the University of Munich.)

එසේ මුත් පාපයෙන් ගැලවීම සඳහා විද්‍යාත්මක ප්‍රතිකර්ම නොදුටු පැරණි ලෝකය සියළු පව් එක් අයකු මත පටවා ඒකා පිටමං කිරීමෙන් ගැලවීමට හැකැයි විශ්වාසයෙන් ක්‍රියා කළෝය. නමුත් ඇත්ත වශයෙන්ම, චේතනාන්විත පාපයන් නිසා ඇති වන සමාජ දූෂණය කොතරම් දරුණුද යත්, එය කිසිසේත්ම උදාසීන කළ නොහැකි යයි ද ඒ සමාජයන් විශ්වාස කර තිබේ. ඒ නිසා, පාපයන් භෞතිකව මිනිස් සමාජයෙන් දුරස්ථ ස්ථානයකට ගෙන යා යුතුය.

"20 ශුද්ධස්ථානයද සම්මුඛ වීමේ කූඩාරමද පූජාසනයද අපවිත්‍රකම් වලින් ආරක්ෂා කරන මෙන් ඔහු කන්නලව් කළ පසු පණ ඇති එළුවාව ඔහු ඉදිරියට ගෙනා යුතුයි. 21 ඉන්පසු ආරොන් තම අත් දෙකම එළුවාගේ හිස මත තබා ඊශ්‍රායෙල් සෙනඟ කළ සියලු අයුතුකම්ද ඔවුන්ගේ සියලු පාපද හෙළි කළ යුතුයි. මෙසේ, ඔවුන්ගේ පව් සියල්ල එළුවා මත පටවා ඌව රැගෙන යැමට සූදානමින් සිටින මිනිසෙකු සමඟ ඌව පාළුකරයට (wilderness) යැවිය යුතුයි. 22 ඔහු එළුවාව පාළුකරයට ගෙන යා යුතුයි. ඌද සෙනඟගේ සියලු පාප දරමින් පිටත්ව යන්නේය." ('යෙහෝවා දෙවිගේ සාක්ෂිකරුවන්'- 'ලෙවී කතාව' පරිච්ඡේදය - 16) (ආරොන් - මෝසස්ගේ සහෝදරයා හා ප්‍රධාන පූජකයා බව කියැවේ) [රබ්බිවරුන්ගේ සාහිත්‍යයේ යොම් කිපූර් පිළිබඳ මෙසියානු පත්‍රිකාවේ, ලෙවි 16 හි විස්තර කර ඇති චාරිත්‍රය, එළුවා මිය යන පරිදි කඳු බෑවුමකින් පහලට එළවා දැමීමේ නියෝගයක් සමඟ අතිරේකව සම්බන්ධ කර ඇත, සමහර විට පාපයෙන් පිරුණු මේ සත්වයාට ජීවත් වීමට ඉඩ දුන්නොත් ඒවා (ඒ පාපයන්) නැවත සමාජයට පිවිසෙනු ඇතැයි යන කනස්සල්ල මින් පිළිබිඹු කරයි. හීබෲ බයිබලයේ එය එක් වරක් පමණක් දක්නට ලැබුණද, ගැළවුම්කාර එළුවකු පිළිබඳ අදහස පුරාණ ලෝකය පුරා පැවතුනකි. හීබෲ බයිබලයට පෙරාතුව මෙසපොතේමියානු ග්‍රන්ථ කිහිපයක ගැලවුම්කාර එළුවා වැනි රූප දක්නට ලැබේ. - Liane Feldman, "Scapegoat",]

කෙසේවෙතත්, මිනීමැරුම් හෝ රූප/ප්‍රතිමා වන්දනාව (idolatry) වැනි බරපතළම පාපවල බලපෑම් ඉවත් කිරීමට ක්‍රමයක් නැත. එවැනි පව්කාරයන් වෙනත් මාර්ග වලින් දෙවියන් වහන්සේට ආයාචනා කළ හැකිය, නමුත් මෙයද අසාර්ථක වුවහොත්, කෘෂිකාර්මික හා ආර්ථික දුෂ්කරතා, අසනීප, ලැජ්ජාව සහ මරණය ඇතුළු ඔවුන්ගේ පාපවල මැලවී යන ප්‍රතිවිපාක ඔවුන් විඳිය යුතුය. ("Sin and Guilt in the Hebrew Bible")

**වර්තමානයේ අභියෝගය**

දැන් වර්තමානයට එළැඹීමේ අවස්ථාවයි. පාපය කුමක් ද?

1. ප්‍රජාතන්ත්‍රීය විප්ලවයේ කර්තව්‍යයන් නොතකා සුදු ජාතිකයන්ගේ දේශපාලන උපාය මාර්ගයන් තුලින්, ඓතිහාසිකව නියමිත සමාජ අරගලය මඟහැර, පසුගාමීත්වය යොදා ගනිමින් ලාංකිකයන් බෙදා පාලනය කිරීම; - ධනපති පංතිය.

2. ධනපති පංතියේ මේ නොහැකියාව ඉක්මවා යමින් ප්‍රජාතන්ත්‍රීය විප්ලවයේ කර්තව්‍යයන් නිර්ධන පංතියේ නායකත්වයෙන් ඉදිරියට ගෙන යෑම සඳහා සටන් කරනවා වෙනුවට මේ ගන්ධබ්බ 'දේශීය ධනපතියන්' සමඟ එක්වීමෙන් රාජ්‍ය ධනවාදය ඔස්සේ සමාජවාදයට යෑමට මාවත් ඇතැයි පෙන්වා නිර්ධන පංති බලය වල් වැද්දවීම; - දේශීය සමාජවාදීන්.

3. සුළු ජාතික කොටස් සතුව තිබෙන ධන සම්පත් ආර්ථික බලය සිඳ දමා සිදු කෙරෙන සංවර්ධන කටයුතු වල මුළු වාසිය තමන් අතට ගැනීමෙන් සිංහලයාට ඉහල ජීවන මට්ටමක් ඇති කර ගත හැකැයි සිතීම; හා ඒ වෙනුවෙන් සුළු ජාතිකයන් 'කල්ලතෝනින්' ලෙස සලකා සමාජයෙන් පසකට කර තැබීමට සටන් කිරීම - සුළු ධනේශ්වර මතවාදීන්,

යනාදිය ප්‍රධාන තැන ගනී.

මෙකී පාපයන් තුලින් සමාජය පසුගාමීත්වයේ රඳවා තබා, සිංහල බෞද්ධ ජාතිවාදයේ අසහාය බලය යොදා ගනිමින් ජාතික විමුක්ති අරගලයන් ලේ ගංගාවක ගිල්ලවා, සමාජ සාරධර්මයන් ම්ලේච්ඡත්වයටත්, ආර්ථික වශයෙන් පරිහානියට රට ගෙන යෑමටත් පංතියක් ලෙස ක්‍රියාකළ ධනේශ්වරය හා සහසම්බන්ධිතව; ඒ පාපයේ සහකරුවන් හා ඌණපූර්කයන් ලෙස ක්‍රියා කළ මධ්‍යම පංතීන් හා සුළු ධනේශ්වර බලවේග වරද කරුවන් වන්නේ ය.

දැන් විවිධ බලවේග ඒ හෝ මේ "Scapegoat" කෙනෙකු යොදා ගෙන පාපය හා වරද විස්ථාපනය කිරීමේ ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වී තිබේ. හොඳයි. එයට හරස් වීමේ අරුතක් නැත. එය පාපිෂ්ඨයෝ හා වරද කරුවෝ අතර ගනුදෙනුවකි. ඒ ගනුදෙනුව කරගැනීමට අප ඉඩ හල යුතුය. පාපිෂ්ඨයෝ පාපයන්ට වගකියාගත්තාවේ.

එහි දී ඒ හෝ මේ කොටසක් මර්ධනයට ලක් කිරීමට තරයේ විරුද්ධ විය යුතුය. කළ යුත්තේ ජන සමාජය මේ පාපයෙන් ගලවාගැන්ම සඳහා ප්‍රජාතන්ත්‍රීය විප්ලවයේ කර්තව්‍යයන් වෙනුවෙන් කැපවීමයි. එහි දී සියළුම මානව අයතීන් වෙනුවෙන් සටන් කළ යුතුය.

මානව අයිතීන් යනු අපරයුධ දේශපාලන එකඟත්වය වෙනුවෙන් ජාත්‍යන්තර කම්කරු පංතිය හා ධනේශ්වරය ඇති වූ දේශපාලන එකගතාවයේ ප්‍රකාශනයකි. එමෙන්ම ඒවා පවත්වාගැනීමට අදාල ජාත්‍යන්තර ආයතන බිහි කෙරුනේ ජාත්‍යන්තර කම්කරු පංතියේ ශක්තිය මතය. ඒ අයිතීන් අපගේ අයිතීන් ය. ඒ අයිතීන් රැක ගැනීමට ජාත්‍යන්තරව මෙන්ම ජාතික වශයෙන් ද සටන් කළ යුතු අතර, ඒ වෙනුවෙන් කෙරෙන සටන් වලදී ක්‍රියාකාරීව සහයෝගය දිය යුතුය.

මේ මානව හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සුරැකීමේ අරගලය තුළ සමාජ ආර්ථික බිඳවැටීම් නිසා නැඟී සිටින ජනතාව සමඟ සංවාදයන් තුලින් එකඟත්වයන් ඇති කර ගැනීම පාලකයන්ගේ වගකීමයි. ඒ වගකීම ඉටු කිරීමට ක්‍රියා නොකර ජනතාවගේ අරගල යටපත් කිරිමට විවිධාකාර මර්ධන නීති යොදා ගැනීමට යෑම නැවත නැවතත් පාපයේ ගැලීමක් වන්නේ ය.

පාපීන් එලවා දැමීමේ අරගලය තුළ ඔවුන් පිටමං කිරීමේ අරගලය බද්ධ වීම ස්වාභාවිකය. මන්ද යත් මොවුන් සිටිනාතාක් පාපයේ හා වරදේ බලපෑමෙන් ගැලවීමට නොහැකිය යන හැඟීම තම අභ්‍යන්තරයේ කැකෑරෙන නිසාය. ඒ පිටමං කිරීමට හෝ දඬුවම් දීමට අදාල නීතිමය පියවර ගැනීම

යුතුය. නීති ශක්තිමත් මදිනම් නව නීති ඇති කළ යුතුය. නීතිය කාටත් පොදු බැවින් අනාගතයේ දී පාපයන්හි යෙදීම දෙවරක් සිතිය යුත්තක් වනු ඇත.

නමුත් සියල්ලට වඩා ප්‍රධාන වන්නේ, සැමට යුක්තිය සාධාරණත්වය නිදහස හා ස්වපාලනය!; සැමට ප්‍රජාතන්ත්‍රවාදය පළමුව! යන සටන්පාඨ වෙනුවෙන් වීදි බසින්නැයි මුළු සමාජයටම ආරාධනා කිරීමයි.

මෙහි දී මේ සියළු පාපායන්ගේ දරුණුතම විපත්තීන්ට ගොදුරුව වේදනා විඳින දෙමළ ජනතාවගේ ආසන්න ප්‍රශ්න, එනම් උන්හිටි ඉඩම් යලි ලබාගැනීම, තමන්ගේ ස්ථාවර ප්‍රාග්ධනය වන වන ගහනයන් සුපුරුදු පරිදි නිදහයේ පරිහරණයට ඉඩ සැලසීම, පැරණි ගල්කනු යොදා ගනිමින් අක්කර සිය දහස් ගණන් වනගත බිම් 'අධි ආරක්ෂක කලාප කිරීම' නැවතීම, අතුරුදහන් වූවන්ගේ ඉරණම, දේශපාලන සිරකරුවන්, දේශපාලන සංවිධාන තහනම, හමුදා පාලනයකට යටත් කර තැබීම ආදී ප් රශ්න වලට අදම විසඳුම් ඉල්ලා කරන උද්ඝෝෂණය ඉතාම ප්‍රාථමික වන්නේ ය.

මේවා, එසේ ආරාධනාවක් කිරීමට යුක්ති සහගත අයිතියක් ඇත්තවුන් බවට පත් වීම සඳහා ගත යුතු ප්‍රාථමික පියවර අතර ඉතා වැදගත් වෙයි.

මේ කර්තව්‍යයන් කිසිසේත්ම ඒ හෝ මේ පාලකයකුගේ පුද්ගලික දයා කරුණාවෙන් විසඳුම් ලැබෙන දෑ නොවේ. නිරන්තරව අවදිව සිටින ප්‍රතිගාමී බලවේග ඔවුන්ගේ දෑත් අඹරවමින් සිටී. මේ බලවේගයන්ට මුහුණ පාර්ලිමේන්තුව තුලින් ස්වාභාවිකව දියත් වන්නක් ද නොවේ. ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් ප්‍රජාතන්ත්‍රවාදී බලවේග කැඳවා වීදි වලදී විසඳා ගත යුත්තකි. එනම් එය ඊනියා ''ප්‍රජාතත්ත්‍රවාදී ව්‍යවස්ථාවක'' කරපිට නැගීමෙන් නොව, විප්ලවකාරී ජනතා බලයක් තුලින් ඉටු කළ යුතු කර්තව් යයන් බවයි එහි අරුත වන්නේ.

**නිමාව**
**<u>ගෝලීය ධනවාදය සොයා යෑම</u>**

ලෝක තත්ත්වය අමාරුය. නමුත් ලෝකය හැරදමා හුදකලාව ජීවත් වීමට නොහැකි ය.

රුසියානු නිර්ධන පංති රාජ්‍යය පිරිහී ගියේ ය. එසේ සිදු වූයේ රුසියානු විප්ලවය හඹා ආ යුරෝපීය විප්ලවයන්ගේ පරාජයන් නිසාය. මේ පිරිහීම සංකේතවත් කරමින් ලෝක ධනවාදයේ ආරක්ෂක බලයක් ලෙසට ස්ටාලින්වාදය නැගී සිටියේ ය. එය ලෝක නිර්ධනීන් ලද විශාලතම මතවාදී පරාජයකි. මේ පරාජයන් තුල ඒකාධිකාරී ධනවාදය යුධ අවදිය පසු කරමින් යලි ස්ථාවර වූයේ ය. ඒ කලින් පැවති ආකාරයට එකිනෙකා සමඟ තරඟ කරන, බෙදී ගිය අධිරාජ්‍යවාදයන් ගණනාවක් හැටියට නම් නොවේ. ඒ වෙනුවට ඒකාබද්ධව කළමනාකාරී වුනු සුපිරි ගෝලීය ධනවාදයක් හැටියට වර්ධනය වීමෙනුයි.

දැන් මේ තත්ත්වයන් මත ඒකාධිකාරී ධනවාදයේ තුන්වන අවදිය ලෙස ගෝලීය ධනවාදය මතු වනු දැකිය හැකිය. කේන්ස් (John Maynard Keynes) ගේ ආර්ථික න්‍යායයන් මගින් මේ සඳහා ආර්ථික සැලසුම් සපයන ලදී. ඒ අනුව බ්‍රෙටන්වුඩ්ස් ගිවිසුම උඩ ඉහලින් සැලසුම් සහිතව ඇරඹිණි. තර්කානුසාරී යථානුභූතවාදයේ (Logical Positivism) දාර්ශනික පසුබිම, මේ ඒකාබද්ධ ගෝලීය කළමනාකාරිත්වයේ ප්‍රායෝගික සැලසුම් වලට මඟ පෙන්වී ය. ඒකාබද්ධ සමාජ සුබසාධන ප් රතිපත්ති (Social welfare Corporate Polices) මඟින් ලොව පුරා පංති සන්ධාන දේශපාලනය ඇති විය. නමුත් මේ ගමන සුමට වුනේ නැත. ප්‍රංශයේ 1968 විප්ලවය වගේ බරපතල අභියෝග මතු වූයේ ය. නමුත් ධනවාදයේ ගෝලීය සැලැස්ම මේ හැම අභියෝගයක්ම ජය ගත්තේ මූලික ලෙස ප්

රජාතන්ත්‍රවාදී පදනමක් මතයි. පෙරකී අලුත් ආර්ථික සැලැස්ම උඩ ප්‍රජාතන්ත්‍රවාදී පියවර ගැනීමට අනිවාර්ය ඉඩක් ඇති විය. දේශපාලන නිදහස, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, ගැමි ගොවි ප් රතිසංවිධාන, කාන්තාවාදය, කුල - වර්ග බේද තුරන් කිරීම, සමලිංගික නිදහස, මාධ්‍ය නිදහස මේ ආදී කී නොකී සියළු දේට ඉඩ දෙමින් අති විශාල මතවාදී හා ප්‍රායෝගික පරිවර්තනයක් ලෝකය පුරාම ගලා ගියේ ය. ඒ අතරම ආර්ථික බලවේග වල, නිෂ්පාදන බලවේග වල විශාල වෙනසක් ඇති කරමින් Information Technology අවධිය කරා ගමන් ගනු දැකිය හැකිය.

නමුත් ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ ඇත්ත ඉඩ ලැබෙන්නේ ප්‍රාග්ධනයට හා එහි අවශ්‍යතාවයන්ට පමණයි. අධි සූරාකෑම වෙනුවෙන් තහංචි පැනවීම එම ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයේ ම තවත් පැත්තකි. මෙය සිදුවන්නේ ජාතික රාජ්‍යයේ පදනමෙන්. දැන් මේ ඒකාබද්ධව කළමනාකාරී වුන ගෝලීය ධනවාදය තුල අරුමයක් (peculiarity) විදියට ජාතික රාජය පද්ධතියක් සුරකෙනව පමණක් නොවෙයි. සමහර විට සංකීර්ණව තහවුරුත් වූයේ ය. මහා බ්‍රිතාන්‍ය අද ජාතික රාජ්‍ය හතරක් ලෙස පවතී. එසේ වුනත් ඒ මගින් ප්‍රාග්ධනයේ ගලායෑමට අවහිරයක් නොවේ. ඒත් ශ්‍රමය කොටුකර ගැන්මට නම් එයින් වැඩි ඉඩක් ලැබෙනව. නිර්ධන පංතියට ඒ ඒ ජාතිකත්ව අනුව වෙන්වෙලා හිතන්න මෙයින් මඟ පෑදේ. පංතිය මෙල්ල කරගැන්මට මෙය හොඳ පියවරක්. මේ ධනේශ්වර ප් රජාතන්ත්‍රවාදයේ තිබෙන අඳුරු පැත්ත හැටියට සැලකිය හැකියි. අනෙක් අතට යුරෝපීය ජාතික තත්ත්වයක් තුලින් මුලු යුරෝපයම එකට එකතු කර ගැන්මත් ඒ තුළ ශ්‍රම සංචරණයටත් ඉඩ ලැබීමත් ලොකු වරමක් හැටියට ධනපති පංතිය පෙන්වයි. එසේ මුත් මේ තත්ත්වයට එරෙහිව නව ජාතිවාදී, කට්ටිවාදී දේශපාලන සංවිධාන යුරෝපය පුරාම ඇති විය. මේවා ෆැසිස්ට් ව්‍යාපාර ලෙසට නිකම්ම ලඝු කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් නැති වුනත්, මේ පක්ෂ වල ප්‍රතිගාමී ලක්ෂණ ගැන අවධාරණය කළ යුතුය.

ඒ අතර මේ නූතන ප්‍රජාතන්ත්‍රවාදී පෙරලියෙන්, පැරණි යටත් විජිත රටවල් වල නිහඬ ගැමි ගොවි සමාජයත් කඩා ඉහිරී යමින් විශාල වශයෙන් තරුණ තරුණියන් නාගරික සමාජයට තල්ලු කර එවන්නට වූයේ ය. මේ අර්ධ නිර්ධනීන් සෑම සියලු සම්බන්ධතාවයකින්ම මුදනු ලැබූ අය වෙති. ඔවුන්ට කිසිම ස්ථාවර පැවැත්මක් නැත. ඒ අනුව ගැමි සමාජයේ පැවැති බැඳුම්කර සමඟ පැවති ඉතාම අවම වරප්‍රසාදයන් පවා විනාශ කිරීම දැන් ඉතාම හොඳින් කෙරෙයි. රදළ සමාජයේ පමණක් නොවෙයි, වහල් සමාජයේ පවා නිශ්චිත බැමි තිබුණි. වහලාටත් එල්ලෙන්න ස්වාමියෙක් හිටියේ ය. දැන් ගෝලීය ධනවාදය කියන විදියට ධනපති 'නිදහස' දෙමින් තිබේ.

ධනේශ්වර සිවිල් සමාජයේ වහල්භාවය බැලූබැල්මට පෙනෙන්නේ ශ්‍රේෂ්ඨතම නිදහස ලෙසය. එසේ වුවත්, යථාර්ථයේ දී එය පුද්ගලයාගේ පරම වහල්භාවයේ ප්‍රකාශනය මෙන්ම ඔහුගේ මනුෂ්‍ය ස්වභාවය අහිමි වීම හැර අන් කිසිවක් නොවේන බව මාක්ස් පෙන්වා දී තිබේ. මේ අයුරින් මනුස්ස කමේ ඇත්තම අහිමිකම නූතන ප්‍රජාතන්ත්‍රවාදයෙන් ගැමි ජනතාවට ලබා දෙන්නේ යයි කිය හැකිය.

ඒ අනුව ගෝලීය ධනවාදය සමග පොරබැදීම සෑම බිම් අඟලකම සිදු විය යුතුය. පාරක් හදන විට, 'සංවර්ධන'යේදී අස්ථාන ගතවන ජනතාව ගෙන යන අරගලයන්; රාජ්‍ය ආයතන ප්‍රතිව් යුහගතකරණයෙන් අතරමං වන නැත්නම් වරප්‍රසාද අහිමිවන ජනතාවත් යන දෙකොට්ඨාශයම ගෙන යන අරගලයන් නිවැරදි අරමුණක් ඇතිව ඉදිරියට ගෙන යාම අවශ්‍ය වෙයි. ගෝලීය ධනවාදයේ ඇත්ත ස්වරූපයට මුහුණ දීම වෙනුවට 'මිශ්‍ර ආර්ථිකයක්', 'මානවවාදී විවෘත ආර්ථිකයක්' ගැන බොරු පොරොන්දු දෙමින් ජනතාව අඳුරට පත් කිරීමට කිසි ලෙසකින් හවුල් විය නොහැක. මිනිස් අයිතිවාසිකම් රැක ගැනීම ගැන පැහැදිලි යෝජනා තිබිය යුතුය. එසේ නොමැතිව, "ජනසතු දේපොල" මේ තිබෙන ආකාරයෙන් ම රැක ගැනීමට ඉදිරිපත් වීමට තර්ක නැත. එක ධනවාදයක් වෙනුවට තවත් ධනවාදයක් රැකීම ප්‍රතිපත්තියක් බවට පත් කරගත නොහැකි ය. නමුත්

ලබා ඇති කිසිම අයිතියක් නැති වෙන්නට ඉඩ දීමත් නොකළ යුතුය. පොදු අසහනයක් ඇතිවීමට ඉඩ නොදිය යුතුය. හැම කෙනෙකුටම රැකියාවක්, නවීන තාක්ෂණයෙන් දැනුම ලබාදීම, වැඩ අඩු - වැඩි විවේකය හා නිවාඩු වැඩි කිරීම, වැඩියෙන් රැකියා දීම සමඟ එකට සම්බන්ධ කිරීමත්, දිරි දීමනා හැම තැනකම පොදුවේ ඇති කිරීම, වැඩ අනුව ගෙවීම වැඩි දියුණු කිරීම, කලා හා වෙනත් හැකියාවන් වැඩි දියුණු කර ගැනීම ආදී සටන් පාඨ කාලීන වන්නේ ය. මේ අතර ශ්‍රමයේ ගලා යෑමේ නිදහස ගැන ජාත්‍යන්තර තලයේ සටන් කළ යුතුයි. එය නැතිව කිසිම ප්‍රජාතන්ත්‍රවාදී ගිවිසුමක් සැබැවක් වන්නේ නැත.

'සමාජවාදී බලවතුන්' දැන් එක්පසකින් ගෝලීය ධනවාදයේ මූල්‍ය අධිකාරය ඉක්මවා තම මූල්‍ය ප් රාග්ධනය ආයෝජනය සඳහා දඩබිම් සොයා යමින් සිටිති. මේ සිදු වන්නේ ස්ටාලින් නැතිනම් කෘෂෙප්ගේ කාලයේ මෙන් ජාත්‍යන්තර දේශපාලන බලතුලනය පවත්වා ගැනීමේ කටයුතු නොවේ. ඒ අනුව නැගෙනහිර යුරෝපය, වියට්නාමය නැතිනම් කියුබාව සම්බන්ධයෙන් මේ බලවතුන්ගේ ප් රතිපත්ති තේරුම් ගත හැකිය. නමුත් අද ඇත්තේ එවැන්නක් නොවේ. බොහෝ ප්‍රමාදවී ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනයේ පිටුබලයෙන් සංවර්ධන ක්‍රියාදාමයක් දියත්කර එමගින් ගොඩ ගසාගත් අතිරික්ත ප්‍රාග්ධනයක් සඳහා ආයෝජන කලාප හා වෙළඳපලවල් අත්කර ගැනීම වෙනුවෙන් චීනය යුධ ප් රකාශ කර සිටී. රුසියාව තමන්ගේ දියාරු වූ දේශපාලන-ආර්ථික බලය තව දුරටත් තර්ජනයට ලක්විම වලක්වා ගැනීම සඳහා යුධ වැදී සිටී. මේ තතු ඉදිරියේ දේශපාලන වශයෙන් ගෝලීය ධනවාදය අද සිටින්නේ ආරක්ෂාවාදී තැනකය. ඒ න්‍යෂ්ඨික විනාශයක් මගින් ලෝක ශිෂ්ඨාචාරය සදහටම විනාශවී යෑමේ, යලි අනාගතයේදීවත් කිසිම මනුෂ්‍යයකු නොදකින තැනට පත් වෙතැයි කම්පාවෙන් මහහැර සිටීමක් සේ ය. නමුත් "සමාජවාදී බලවතුන්" වියරුවෙන් දත් විලිස්සාගෙන ආක්‍රමණ සූදානම් කරයි.

මේ කිසිවක් හුදු සාකච්ඡාවෙන් හෝ සම්මුතියෙන් කෙළවර කළ නොහැකි දැ නොවේ. නමුත් ආර්ථික බලය පිළිබඳ තරගයට එන්නෝ යුද්ධය මඟහැර ගිය බවක් ඉතිහාසයේ දක්නට නැත.

මේ අභියෝගය සැබෑ ලෙස එල්ලවන්නේ හුදු ගෝලීය ධනවාදයට පමණක් නොවේ. ජාත්‍යන්තර නිර්ධන පංති ව්‍යාපාරයටයි. මානව ශිෂ්ඨාචාරයේ ආරක්ෂාව වෙනුවෙන් ඔවුන් නැගී සිටය යුතු කාලයයි මේ. එසේ නැගී සිට පළමුව සමස්ථ විශ්ව මිනිස් ප්‍රජාවගේත්, සතා සීවාපාගේ සිට දිය ගොඩ වෙසෙන සෑම මට්ටමකම ජීවීන්ගේත්, මේ සැවොම සමගින් ගහ කොල වනාන්තර දිය ඇලි ගංගා ද ඇතුළත් සොබා දහමේත් ඉරණම අතට ගැනීමට කාලය යි මේ. එසේ නැගී සිට අන්ධ මූල්‍ය ප්‍රාග්ධනය මගින් මෙහෙයවන මොලේ විකාර වූ පාලන තන්ත්‍රයන් පිටමං කළ යුතුය. එසේ පිටමං කර, ප්‍රජාතන්ත්‍රීය ආයතන මගින් මෙහෙයවන සමාජයක් ඇති කළ යුතුය. එය කළ හැක්කේ ලෝ වාසී නිර්ධනීන්ගේ නායකත්වයෙන් පමණි.

එසේ නොවුනහොත් මිනිස් සමාජය ම්ලේච්ඡත්වයට පත් වීම හෝ; දෙවියන්, මහඹබා නැතිනම් වෙනත් මැව්මකරුවකුට මේ මිහිතලය දර්ශනය වීමට පෙර පැවති තත්ත්වයට එය පත් වනු නියතය.

පාපයන් කරගැස්සවීමට එළුවන් සොය සොයා යා හැකි කාලයක් නොවේ මේ.